# Fortune

## Towards a **Winning Nation**



වාර්ෂික වාර්තාව 2019 | ஆண்டறிக்கை 2019 | Annual Report 2019

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**
**அபிவிருத்தி லொத்தர் சபை**
**Development Lotteries Board**

DEVELOPMENT LOTTERY
Enriching Your Life

# රට දිනවන වාසනාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2019



# රට දිනවන වාසනාව



*"අති විශාල සාර්ථකත්වයක් සහිත වර්ෂයක් බවට පත්කරමින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජීවිත කෙරෙහි තිරසාර බලපෑමක් නිර්මාණය කර ඇති අපි උසස් අධ්‍යාපන අවස්ථාවන් උදා කරමින් සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත උසස් කරලීමට දායක වුනෙමු. සාර්ථකත්වය කරා පිය නගමින් අපගේ නව පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් සහ ප්‍රාර්ථනාවන් සපුරාලීමටත් නවපකරණ තොරතුරු තාක්ෂණය පදනම් අවස්ථාවන් හඳුන්වා දීමටත් අපි බැඳී සිටිමු"*

# පටුන

| | |
|---|---|
| ආයතනික තොරතුරු | 04 |
| අපගේ දැක්ම සහ මෙහෙවර | 05 |
| අපගේ ඉතිහාසය සැකෙවින් | 06 |
| වැදගත් සංධිස්ථාන | 08 |
| ප්‍රධාන මූල්‍ය තොරතුරු | 10 |
| සභාපතිවරයාගේ පණිවිඩය | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය | 14 |
| අධ්‍යක්ෂක මණ්ඩලය (2019) | 15 |
| වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය | 15 |
| 2019.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය | 16 |
| කළමනාකරණ කණ්ඩායම | 17 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 18 |
| මෙහෙයුම් සමාලෝචනය | 19 |
| අපගේ නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණයක් | 22 |
| තිරසාරාත්මක වාර්තාව | 30 |
| ආයතනික පාලනය | 34 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 37 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 39 |

# මූල්‍ය වාර්තා

| | |
|---|---|
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 42 |
| කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 54 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 64 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 65 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 66 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 67 |
| ගිණුකම්රණ ප්‍රතිපත්ති | 68 |
| අංශමය වාර්තාව | 72 |
| අවසාන ගිණුම් සඳහා සටහන් | 74 |
| දස වසරක සාරාංශය | 86 |

# ආයතනික තොරතුරු

**ආයතනයේ නම**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නෛතික ස්වරූපය**
මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කර ඇත.

**ආරම්භක දිනය**
1983 ජනවාරි 19

**කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය**
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 2.

**දුරකථන අංක**
0112 333 546-8, 0114 824 824

**ෆැක්ස්**
0112 333 545

**විද්‍යුත් තැපෑල**
info@dlb.lk

**වෙබ් අඩවිය**
www.dlb.lk

**බදු හඳුනා ගැනීමේ අංකය**
409089844

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය**
එච්.ජී. සුමනසිංහ මහතා - සභාපති / ප්‍රධාන විධායක නිලධාරී (වැඩ බලන)
රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා - අධ්‍යක්ෂ
නීතිඥ ජැනට් ජයවර්ධන මහත්මිය - අධ්‍යක්ෂ
ජේ. එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය - අධ්‍යක්ෂ

**විගණක**
විගණකාධිපති

**බැංකුකරුවන්**
මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව

## දැක්ම

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම."

## මෙහෙවර

"නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම."

## ඉලක්ක

- වෙළඳපොළ කොටස වැඩි කර ගැනීම
- ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම
- නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම

## අපගේ මූලික සාරධර්ම

| | |
|---|---|
| **සුපිලිපන්බව** | අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ. |
| **සුභවාදී ආකල්පය** | ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී. |
| **ප්‍රතිඵලදායක බව** | ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති. |
| **නව්‍යතාවය** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරගකාරී වෙළඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති. |
| **කණ්ඩායම් හැඟීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා එකාවන්ව කටයුතු කරති. |
| **විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති. |

# අපගේ ඉතිහාසය සැකෙවින්

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විකාශනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1983 වර්ෂයේ දී මුලින් ම ස්වකීය මෙහෙයුම් ආරම්භ කළ අවස්ථාවේදී එය සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලැබීය. අධ්‍යාපන සංවර්ධනය සඳහා අරමුදල් සපයා දීම, ජනාධිපති අරමුදල සමග මණ්ඩලයෙහි ඓතිහාසිකව පවතින සමීප සම්බන්ධතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය ආධාර සපයා දීම සඳහා අරමුදල් සපයා දීම සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා අරමුදල් සැපයීම මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණු වේ.

විවිධ වූ දේශීය මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් සඳහා අරමුදල් යෙදවීම පිණිස අඛණ්ඩ ආදායම් උත්පාදන යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කළ ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ‘ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමය’ හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය.

ඒ අනුව, සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා එවක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් රුපියල් මිලියන 1.5 ක මුදලක් වෙන් කර දීම සහ අමාත්‍ය ලලිත් අතුලත්මුදලි මහතා විසින් ඒ හා සමාන මුදලක් මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලෙන් ආයෝජනය කිරීම එම ඉල්ලීමට ලැබුණු සතුටුදායක ප්‍රතිචාර දෙක විය.

අරමුදලෙහි ශක්තිමත් දැක්මට අනුව, අලෙවි කරන ලද මුල් ම ලොතරැයිය ‘සංවර්ධන ලොතරැයි’ යනුවෙන් නම් කරන ලද අතර, පසුව ජනාධිපති අරමුදලෙහි සහ මහපොල ශිෂ්‍යත්ව අරමුදලෙහි මූලික අරමුදල් සැපයීම මත 1983 ජනවාරි 19 වැනි දින සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදි. සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය වැදගත් ජයග්‍රහණ අත්කර ගනිමින් ස්වකීය මෙහෙයුම් ආරම්භ කර පළමු වසර තුළදී සාර්ථකව ආදායම් උපයා ගත්තේය. මෙහි ලාභයෙන් වැඩි ප්‍රමාණයක් මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ කොටස්කරුවන් වන ජනාධිපති අරමුදල සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ලබා දෙන ලදී. අද දක්වා ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ආදායම රට තුළ ධනය උත්පාදනය කිරීමේ මූලික අභිප්‍රාය උදෙසා ජනාධිපති අරමුදලට බැර කර ඇත.

ජනාධිපති අරමුදල විසින් එම ආදායමෙන් 50% ක් රටෙහි උසස් අධ්‍යාපනය සඳහා වැදගත් සහායයක් සපයා දෙන  මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා වෙන් කරනු ලබයි. 1993 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ‘සංවර්ධන ලොතරැයි අරමුදල’ නමින් හැඳින්වූ අරමුදලක් බවට පරිවර්තනය කරන ලදී. ඉන් අනතුරුව 1997 අගෝස්තු 12 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ක්‍රියාත්මක වීමත් සමග සංවර්ධන ලොතරැයි භාරය ‘සංවර්ධන ලොතරැයි මණ්ඩලය’ ලෙස යළි ස්ථාපනය කරන ලදි. ‘සංවර්ධන ලොතරැයිය’ නමින් හැඳින්වූ පළමු ‘ක්ෂණික/සූරන’ ලොතරැයි පත් එකක් රු.10/- බැගින් වූ මුදලකට දිවයින පුරා විසිරී ඇති අලෙවිකරු ජාලය හරහා අලෙවි කරන ලද අතර, පැය 24 ක් ඇතුළත සුපිරි ජයමල්ල ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහි කළ එම ලොතරැයිය මෙම ව්‍යාපාරයෙහි දීර්ඝ කාලීන ජනප්‍රියතාවය ශක්තිමත් කිරීමට මග පෑදුවේය.

1987 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය විසින් ‘ශනිදා වාසනාව’ නමින් ප්‍රථම වරට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලොතරැයියක් හඳුන්වා දෙන ලද අතර මුලදී එය සෙනසුරාදා දිනවල විකාශය විය. ක්ෂණික සූරන ලොතරැයි වලින් ජයග්‍රහණ හිමි නොවූ ටිකට්පත් සඳහා ම විශේෂයෙන් සකස් කර 1998 ජනවාරි 25 වැනි දින ආරම්භ කරන ලද ‘වාසනා චක්‍රය’ වැඩසටහන ඉරිදා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශය කරන ලදි.

එම වැඩසටහන් සඳහා ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබීම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ‘සංවර්ධන වාසනාව’ නමින් රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින දෙවන ලොතරැයිය හඳුන්වා දෙන ලද අතර එය අඟහරුවාදා සහ සිකුරාදා දිනවල විකාශය කරන ලදි.

වාසනාවන්තයින් බිහිකිරීම උදෙසා අංකවලට අමතරව, සංවර්ධන වාසනව ලොතරැයිය මගින් ලග්න සංකේතයක් භාවිතා කිරීමේ නවතම අංගයක් දියත් කළේය.

නියමිත සුපිරි ජයමල්ල ත්‍යාග සහ සාමාන්‍ය මුදල් ත්‍යාග ලොතරැයි වලට අමතරව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2004 ජනවාරි 26 වැනි දින ‘ජයෝදා’ නමින් දිනුම් ඇදීම දියත් කළ අතර එය සඳුදා සහ බ්‍රහස්පතින්දා දින වල රූපවාහිනිය ඔස්සේ විකාශය විය. එහි සුපිරි ජයමල්ල ත්‍යාගය රුපියල් මිලියන 10 ක ආරම්භක මුදලකින් ආරම්භ වෙයි. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී පියවරක් තබමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජයෝදා නියත සුපිරි ජයමල්ල ත්‍යාගයේ ජයග්‍රාහකයින්ට රුපියල් මිලියනයක මුදල් ත්‍යාගය හෝ රුපියල් මිලියනයකට අධික වටිනාකමකින් යුත් නිවසක් තෝරා ගැනීමට අවස්ථා හිමි කර දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2009 අප්‍රේල් 10 වැනි දින ‘ජන ජය’ ලොතරැයිය එළිදැක්වූ අතර එය බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල විකාශය කරන ලදී. වාසනාවන්තයින් සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64 ක් අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 4 සමග

තවත් යන්ත්‍රයකින් අංක 12 ක් අතරින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැළපිය යුතුය. මෙහි සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 2.5 ක මුදලකින් ආරම්භ වේ. 2012 ජුලි 11 වැනි දින 'සුපර් බෝල්' ලොතරැයිය හඳුන්වා දීම මෙරට ලොතරැයි ඉතිහාසයේ පෙරලිකාර සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. රුපියල් මිලියන 30 ක ත්‍යාග මුදලකින් ආරම්භ වන මෙම සුවිශේෂී ලොතරැයිය මෙරට විශාලතම සුපිරි ජයමල්ල ත්‍යාග මුදල පිරිනමන ලොතරැයිය වූ අතර, එය මෙරට ජනතාව අතරින් විශාල ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය. 2016 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ නව ලොතරැයි ගණනාවක් හඳුන්වා දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2016 මැයි 14 වැනි දින 'සංවර්ධන ලක්ෂපති' ලොතරැයිය දියත් කළ අතර එය මිලියන 5.6 ක සුවිශේෂී අලෙවියක් වාර්තා කළේය. එමෙන්ම, 2016 අප්‍රේල් 8 වැනි දින දියත් කරන ලද 'කෝටිපති ශනිදා' ලොතරැයියෙහි ආරම්භක විකුණුම් වටයේ දී ම ලොතරැයි පත් මිලියන 4.4 ක් අලෙවි විය.

නව බලාපොරොත්තුවක් ඇතිකරවමින්, නව ආකර්ෂණයක් සහිතව මුදල් ත්‍යාග තුනක් සමගින් හඳුන්වා දෙන ලද 'සංවර්ධන වාසනාව' රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම 2016 දෙසැම්බර් 12 වැනි දින දියත් කරන ලදී. එයට අමතරව, 2017 අගෝස්තු 31 වැනි දින 'අද කෝටිපති' ලොතරැයිය ද හඳුන්වා දෙන ලදී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලද්දේ ජනාධිපති අරමුදල සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා අරමුදල් රැස් කිරීම පිණිසය. එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සියලු ලාභ ජනාධිපති අරමුදල වෙත බැර කරනු ලැබේ. ඒ අනුව, මණ්ඩලයේ ඉතිහාසය පුරාවට මණ්ඩලය ජනතාව වෙනුවෙන් වූ පොරොන්දුව ඉටුකරමින් පසුගිය වසර 37 ක කාලය තුළදී ජනාධිපති අරමුදලට ලබා දෙන දායකත්වය ලෙස එම අරමුදලට රුපියල් බිලියන විසිහතකට (27) අධික මුදලක් ප්‍රේෂණය කර ඇත.

# වැදගත් සන්ධිස්ථාන

## 1983

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී**

## 1987

**මෙරට ප්‍රථම වතාවට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලද 'ශනිදා වාසනාව' ලොතරැයිය හඳුන්වා දීම**

## 1993

**'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම**

## 1997

**'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් ලෙස 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් නැවත සථාපිත කිරීම.**

- රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ළඟා කරගන්නා ලදී.

## 1998

**ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සූරන ලොතරැයි පත් සඳහා 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම හඳුන්වා දීම**

- ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 100 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.

## 1999

**වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.**

## 2004

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව 'ජයෝදා' ලොතරැයිය දියත් කරන ලදී.**

- රුපියල් බිලියන 3 ක සමස්ත පිරිවැටුමක් අත් කරගන්නා ලදී.

**2008**

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 යන ලිපිනයෙහි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී.

- රුපියල් බිලියන 5 ක සමස්ත පිරිවැටුමක් වාර්තා කරගන්නා ලදී.

**2010**

සුපිරි ජයමල්ලක්" සමග 'ජන ජය' ලොතරැයිය හඳුන්වා දීම

**2011**

'නියත ජය' ලොතරැයිය ආරම්භ කිරීම

**2012**

රුපියල් මිලියන 30 ක සුපිරි ජයමල්ල සමග 'සුපර් බෝල්' ලොතරැයිය' හඳුන්වා දීම

**2013**

ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමන 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය හඳුන්වා දීම

**2014**

කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය දියත් කරන ලදි

**2016**

'සංවර්ධන ලක්ෂපති', 'කෝටිපති ශනිදා' සහ 'සංවර්ධන වාසනාව' යන ලොතරැයි ආරම්භ කිරීම

**2017**

'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දීම

**2018**

IVR සහ කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ප්‍රතිඵල පිළිබඳ දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි

**2019**

'DLB Sweep App' යෙදවුම දියත් කිරීම

# ප්‍රධාන මූල්‍ය තොරතුරු

## ආදායම (රු)




## බදු පෙර ලාභය




## ජනාධිපති අරමුදලට දායකත්වය (රු.)




## ආදායම් බදු




## රජය වෙත ලබා දුන් මුළු ප්‍රේෂණ




## මුළු වත්කම්



| මෙහෙයුම් ප්‍රතිඵල | 2019 | 2018 |
|---|---|---|
| ආදායම | 17,065,414,012 | 15,854,856,246 |
| දළ ලාභය | 7,117,747,971 | 6,580,641,989 |
| බදු පෙර ලාභය | 2,897,130,924 | 2,735,247,442 |
| බදු වියදම් | 235,073,385 | 553,166,576 |
| ශුද්ධ ලාභය | 2,668,792,667 | 2,187,603,956 |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය | 2,191,000,000 | 1,968,000,000 |

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| වත්කම් | | |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 1,245,588,144 | 719,081,433 |
| සේවක ප්‍රතිලාභ වත්කම් | 7,038,067 | 2,271,294 |
| ස්ථාවර තැන්පතු | 1,451,307,572 | 1,218,142,035 |
| තොග | 51,026,204 | 80,340,650 |
| වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු වෙනත් | 126,012,880 | 169,375,594 |
| පෙරගෙවීම් සහ තැන්පතු | 5,212,271 | 11,633,780 |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | 795,666.048 | 461,682,393 |
| **මුළු වත්කම්** | **3,681,851,186** | **2,662,527,179** |

| වගකීම් | | |
|---|---|---|
| සේවක ප්‍රතිලාභ වගකීම් | - | - |
| අලෙවි නියෝජිතයින්ට හා බෙදාහරින්නන්ට ගෙවිය යුතු තැන්පතු | 36,110,381 | 35,395,381 |
| ගෙවිය යුතු ණය වවුචර් | 160,547,860 | 94,273,760 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු | 563,493,496 | 671,110,675 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | 477,792,667 | 237,466,297 |
| ගෙවිය යුතු ත්‍යාග | 760,794,203 | 648,835,116 |

| ස්කන්ධය | | |
|---|---|---|
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොල භාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | 1,103,197,285 | 971,045,950 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 575,515,293 | |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **3,681,851,186** | **2,662,527,179** |

| ලාභදායිතා අනුපාතය | | |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 17% | 17% |
| දළ ලාභ අනුපාතය | 42% | 42% |

| ද්‍රවශීලතා අනුපාතය | | |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.64 | 1 : 1.37 |
| ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතය | 1: 1.60 | 1 : 1.31 |

# සභාපතිතුමාගේ පණිවුඩය සහ 2019 ප්‍රගති වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය සැම විටම වෙනස් වෙමින් පවතින පාරිභෝගක රුචිකත්වයන්ට අනුගත වෙමින් කටයුතු කර ඇති අතර, පසුගිය මාස 12 ක කාලය තුළ අපි සමාජයට වැදගත් දායකත්වයක් ලබා දී ඇති බව අපි විශ්වාස කරන්නෙමු.

මම 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මෙයින් ඉදිරිපත් කරමි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි විශ්වාසය තබා අපගේ ලොතරැයි නිෂ්පාදන මිලදී ගන්නා ශ්‍රී ලාංකික ජනතාව වෙත රජය විසින් නියාමනය කරනු ලබන ලොතරැයි නිෂ්පාදන අලෙවි කරනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වශයෙන් අපි සහතික වන්නෙමු. මිලදී ගන්නා සෑම ලොතරැයියක් මගින් ම තමන් ද අප සමාජයේ දියුණුව උදෙසා ලබා දෙන දායකත්වය පිළිබඳව ජනතාව දැනුවත්ව සිටින බව අපි විශ්වාස කරන්නෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලයට කොටස් හිමියන්ගේ අපේක්ෂාවන් සහ ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් සංතුලිත කරමින් පසුගිය මූල්‍ය වර්ෂය තුළදී ද මෙම වගකීම ඉටු කිරීමට හැකි විය.

සමාජ වගකීම සංතුලනය කර ගන්නා අතර ම අපගේ ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ ප්‍රතිලාභ ලබා දීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කැපවීම පිළිබිඹු කෙරෙන අතර, මණ්ඩලය විසින් ගනු ලබන විධායක මට්ටමේ තීරණ මගින් එහි හේතු සහගත බව තවදුරටත් තහවුරු වෙයි.

ජනාධිපති අරමුදලට රුපියල් මිලියන 2191 ක දායකත්වයක් සපයා දෙමින් සහ පෙර වසරට සාපේක්ෂව 8% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වර්ෂයේ දී මණ්ඩලය රුපියල් බිලියන 17.1 ක පිරිවැටුමක් අත්කර ගැනීමට සමත් වූ බව වාර්තා කිරීමට හැකිවීම මණ්ඩලයට ඉමහත් සතුටක් ගෙන දෙන කරුණකි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිවල වාර්ෂික වර්ධන වේගය 8% කි.

| | 2019 | 2018 | විචලනය | වෙනස්වීම % |
|---|---|---|---|---|
| ආදායම (රු.මි.) | 17,065 | 15,854 | 1,211 | 8% |
| බදු පසු ලාභය (රු.මි.) | 2,668 | 2,187 | 481 | 22% |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි.) | 2191 | 1968 | 223 | 11% |

## වර්තමාන මූල්‍ය සමාලෝචනය -2020

කොවිඩ්-19 වසංගතය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම්වලට පුරෝකථනය කළ නොහැකි තරමේ අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රට වසා තැබීම නිසා 2020 මාර්තු 18 සිට මැයි 18 දක්වා කාලය තුළදී මණ්ඩලයේ මෙහෙයුම් කිසිවක් සිදු කර නැත. මේ හේතුවෙන් 2020 මුදල් වර්ෂය සඳහා මණ්ඩලයට දළ වශයෙන් රුපියල් මිලියන 3,256 ක ලොතරැයිපත් අලෙවියක් අහිමි වී ඇත. එමෙන්ම, පහත වගුවෙහි පෙන්වා ඇති පරිදි මණ්ඩලය 2020 ජූලි 31 වැනි දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා ජනාධිපති අරමුදලට ලබා දීමට ඉලක්ක කර තිබූ දායකත්වයට වඩා රුපියල් මිලියන 568 ක් පසුපසින් සිටියි

| | 2020 ජූලි දක්වා | 2020 ජූලි දක්වා | විචලනය | වෙනස්වීම % |
|---|---|---|---|---|
| | අයවැය | තථ්‍ය | | |
| දළ අලෙවිය (රු.මි.) | 10,786 | 7,529 | (3,256) | -30% |
| මුළු බදු (රු.මි.) | 1,219 | 269 | (950) | -78% |
| බදු පෙර ලාභය (රු.මි.) | 1,952 | 1,358 | (594) | -30% |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි.) | 1,830 | 1,262 | (568) | -31% |

### .අපගේ ජයග්‍රහණ

2019 වර්ෂයේ දී අපි ජනාධිපති අරමුදලට රුපියල් මිලියන 2,191 ක් පරිත්‍යාග කළ අතර එමගින් අපිට සමාජ සංවර්ධනය සඳහා කැපවී සිටින අතර ම අපගේ වර්තමාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ද හැකියාව ලැබුණි. එයට අමතරව, අපි එම කාල සීමාව සඳහා අපගේ අයවැයගත වාර්ෂික අලෙවි ඉලක්කයෙන් 100% ක් පමණ ම ළඟා කර ගත්තෙමු. මෙම වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි පිරිවැටුම රුපියල් බිලියන 17.1 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 8% ක වර්ධනයකි.

### නව සංධිස්ථාන

අප වටා ඇති පුළුල් සමාජය කෙරෙහි අපට වගකීමක් තිබේ. ඒ නිසාම වසර ගණනාවක් මුළුල්ලේ අපගේ ගමන සාර්ථක කර ගැනීමට දායක වූ සමාජය වෙත අපගේ ලාභය නැවත ලබා දීමට අපට හැකි වී තිබේ. ගෙවන ලද ත්‍යාග මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 8.9 කි. උපයන ලද ලාභ ප්‍රධාන වශයෙන් ම ජනාධිපති අරමුදල වෙත ලබා දෙනු ලබන අතර එම මුදල් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට සහ ආර්ථික දුෂ්කරතා ඇති පුද්ගලයින්ට වෛද්‍ය ආධාර ලබා දීමට යොදා ගනු ලැබේ.

### අපගේ කණ්ඩායම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ක්‍රියාශීලී සහ ප්‍රබල කණ්ඩායම අපගේ සාර්ථකත්වයෙහි මූලික ම කොටසක් වේ. අපගේ අලෙවිකරණ, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන අංශවල කණ්ඩායම් එහි ඉදිරියෙන් ම සිටිති. ප්‍රසම්පාදන හා මානව සම්පත් අංශවලට අලුතින් බඳවාගත් සුවිශේෂී නායකයින් දැනට සිටින කණ්ඩායමට තවදුරටත් ප්‍රබලත්වයක් එක් කර ඇත. ඔවුන්ගේ නව්‍ය වූ අදහස් අපගේ නිෂ්පාදන ඉදිරියට ගෙන යමින් සහ ලොතරැයි අත්දැකීම්වලට

නව මානයන් ගෙන එමින් මණ්ඩලය ඉහළ තලයකට ඔසවා තබා ඇත.

## නව තාක්ෂණය

පැය 24 පුරා ම ක්‍රියාත්මක Interactive Voice Response ප්‍රතිචාර දැක්වීමේ පද්ධතිය හරහා යෙදවුමක් හඳුන්වා දීම මගින් අපි තවත් ජයග්‍රහණයක් අත් කර ගත්තෙමු. DLB Sweep App යෙදවුම මගින් පරිශීලකයින්ට ස්මාර්ට් ජංගම දුරකථන හරහා තමන්ගේ ජයග්‍රහණ පරීක්ෂා කර බැලීමට අවස්ථාව උදා කර දෙන ලදී. ජංගම දුරකථනය මගින් ලොතරැයි පතෙහි ඇත QR කේතය පරිලෝකනය කිරීමෙන් පාරිභෝගිකයින්ට තමන්ගේ ජයග්‍රහණ සහ අදාළ ත්‍යාග මුදල් පිළිබඳ තහවුරු කර ගැනීමට ද එයින් අවස්ථාව සලසා දෙයි.

## ආයතනික සමාජ වගකීම් ක්‍රියාමාර්ග

අපගේ අලෙවිකරුවන් අතර ලොතරැයි අලෙවි කුටි 274 ක් බෙදා දෙන ලද අතර එමගින් රැකියා අවස්ථා උදා කර දීමට අපට හැකි විය. එයට අමතරව අපි ලොතරැයි අලෙවි කවුළු 255 ක ස්ටිකර් අලවා ඒවාට අනුග්‍රාහකත්වය ලබා දී, අම්පාර, බදුල්ල, නුවරඑළිය, ගාල්ල, හම්බන්තොට සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ලොතරැයි අලෙවි නියෝජිතයින් සඳහා වෛද්‍ය කඳවුරු පවත්වා, ආබාධිත අලෙවි සහායකයින් අතර ට්‍රයිසිකල් 63 ක් ද බෙදා දී ඇත. ජනාධිපති අරමුදලට දායකත්වය සපයා දීමට අමතරව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි අලෙවි නියෝජිතයින්ගේ දරුවන්ට උපකාර කිරීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ද හඳුන්වා දුන්නේය. මෙම වර්ෂයේදී ඔවුන්ගෙන් 25 දෙනෙකු පමණ එහි ප්‍රතිලාභ ලැබූහ. එමෙන්ම, මෙම කාල පරිච්ඡේදය තුළදී අපි විවිධ ප්‍රදේශවල පන්සල්වලට සහ ආගමික හා සංස්කෘතික උත්සවවලට දායකත්වය ලබා දෙමින් සහ උපකාර කරමින් තවත් ප්‍රජා සේවා ව්‍යාපෘති රාශියක් ද ක්‍රියාත්මක කළෙමු.

## ඉදිරි දැක්ම - 2020

කොවිඩ්-19 වසංගතයත් සමග මෙම කර්මාන්තය නව අභියෝගයකට මුහුණ දී සිටියි. කෙසේ වෙතත්, වෙහෙස මහන්සියෙන් කැපවී, සංයමයෙන් කටයුතු කිරීම තුළින් මෙම අභියෝග මධ්‍යයේ අපි අඛණ්ඩව වර්ධනය වෙමු. වර්ධනය හා සමාජ වගකීම කෙරෙහි අපගේ ඇති නොසැලෙන කැපවීම කිසිසේත් අඩු නොවනු ඇත.

1. කොවිඩ්-19 වසංගත තත්වයෙහි බලපෑම මගහරවා ගැනීම සඳහා මණ්ඩලය සිය ප්‍රමුඛතම වෙළඳ සන්නාම හතර දෛනික පදනමකින් හඳුන්වා දී ඇත. ඒ අනුව ශනිදා වාසනාව, ලග්න වාසනා, අද කෝටිපති සහ සුපර් බෝල් යන ලොතරැයි දැන් දිනපතා ම දිනුම් අදිනු ලැබේ. එයට අමතරව, එම දිනුම් ඇදීම් වලදී ප්‍රවර්ධනය කිරීමක් ලෙස ආකර්ෂණීය දෙවන දිනුම් ඇදීමක් ද හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාමාර්ග දියත් කිරීමත් සමග අපගේ අලෙවියෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත්වී ඇති බව අපි නිරීක්ෂණය කර ඇත්තෙමු.

2. එමෙන්ම, E-APP පදනම් කරගනමින් වෙළෙඳපොළට ලොතරැයි හඳුන්වා දීම සඳහා ද දැනටමත් කටයුතු සූදානම් කර ඇත.

3. ඩිජිටල් ලොතරැයියක් වන සසිරි නමින් හඳුන්වන නව ලොතරැයි නිෂ්පාදනයක් ද දියත් කර ඇත. මේ හරහා අපගේ අලෙවිය ඉහළ නැංවීම සඳහා නව වෙළඳපොළක් ග්‍රහණය කර ගැනීමට අපි බලාපොරොත්තු වෙමු. මෙහි වෙළඳපොළ ඉලක්කගත කණ්ඩයම වන්නේ අන්තර්ජාල වෙළඳපොළෙහි ඉහළ වියදම් සිදු කරන ගනුදෙනුකරුවන් ය.

4. අලෙවිය වැඩි කිරීමේ අරමුණ ඇතිව දිනකට හතරක් ව තිබූ දෛනික දිනුම් ඇදීම් සංඛ්‍යාව 2020 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි දිනකට පහක් දක්වා වැඩි කරන ලදී.

5. තවද, ජංගම දුරකථන භාවිතා කරන්නන් සඳහා කෙටි පණිවුඩ සේවාව පදනම් කරගත් ලොතරැයියක් හඳුන්වා දීමට ද මේ වන විට කටයුතු සූදානම් කර ඇත.

අතිගරු ජනාධිපතිතුමා, ගරු මුදල් අමාත්‍යතුමා සහ භාණ්ඩාගාර ලේකම් තුමා ලබා දෙන සහයෝගය හා මග පෙන්වීම වෙනුවෙන් මාගේ හෘදයාංගම කෘතවේදීත්වය මෙයින් පළ කර සිටිමි. පසු ගිය කාලය මුළුල්ලෙහි සහ වර්තමානයේදී ද එකට එක්වී අපගේ ප්‍රජාවන්ට සහයෝගය දක්වමින් අපගේ ගනුදෙනුකරුවන්ට සුවිශේෂී සේවාවක් සපයා දී ඇති සහ අඛණ්ඩව සපයා දීමට තටයුතු කරන ඉතා දක්ෂ හා කැපවීමෙන් සේවය කරන අපගේ කාර්ය මණ්ඩලයෙහි සහාය ඇතිව දැනුම ලබා ගනිමින් හා බෙදා ගනිමින් අපගේ විවිධ පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීමට අවස්ථාව ලැබීම ඉතා වටිනා අත්දැකීමක් වී තිබේ.

සියලුම දිනුම් ඇදීමේ විනිසුරුවන්, ජනාධිපති අරමුදලෙහි කාර්ය මණ්ඩලය, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලෙහි කාර්ය මණ්ඩලය, අපගේ බෙදාහරින්නන්, අලෙවිකරුවන්, අලෙවි සහායකයින්, ප්‍රතිචිකුණුම්කරුවන්, ජනමාධ්‍ය, බැංකුකරුවන්, සියලුම සේවා සපයන්නන් සහ අපගේ සියලුම විධායක කාර්ය මණ්ඩල නිලධාරීන්, විශේෂයෙන් ම සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් යන සියලුම දෙනාට මම විශේෂ ස්තුතිය මෙයි පුද කර සිටිමි. එමෙන්ම, දැඩි කැපවීමෙන් යුතුව, තම කාර්ය භාරය මැනවින් ඉටු කරමින් මණ්ඩලයෙහි සාර්ථකත්වය උදෙසා තම දායකත්වය සපයා දෙන, සියලුම කාණ්ඩ වලට අයත් අපගේ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ද මාගේ ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාව කර ගනිමි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අපි සපයා දෙන සේවය අර්ථවත් කිරීමට ඔවුන් සැබවින් ම අපට සහාය වී ඇත. එමෙන්ම, අපගේ සේවාවන් සඳහා අනුග්‍රහය දක්වන අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට ද අපගේ ස්තූතිය පුද කරමු. ඔවුන්ගේ අනුග්‍රහය නොතිබෙන්නට අපට මෙම සාර්ථකත්වයන් අත්කර ගැනීමට නොහැකි වනු ඇත. තවද, අප වෙත ඉතා වටිනා දායකත්වයක් සපයා දෙන විගණන අධිකාරී සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද අපගේ ස්තූතිය පුද කරන්නෙමු.

අවසාන වශයෙන්, මෙම ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාර්ශවකරුවන්ට මම ස්තූතිවන්ත වන අතර ඉදිරි වර්ෂවලදී ද ඔබගේ අඛණ්ඩ සහයෝගය මම අපේක්ෂා කරමි.



**එච්.ජී. සුමනසිංහ**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
(වැඩ බලන)

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය කරනු ලැබේ. ජනාධිපති අරමුදලට සහ මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අරමුදල් සැපයීම මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණු වේ. පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂයේදී ද මුදල් ත්‍යාග විශාල ප්‍රමාණයක් ගෙවමින්, ඇතැම්විට ගනුදෙනුකරුවන්ට ගෙවන ත්‍යාග මුදල් වැඩි කරමින්, ජනාධිපති අරමුදල සඳහා ද රුපියල් මිලියන 2,191 ක් ප්‍රේෂණය කරමින් අපගේ විකුණුම් වලින් සැලකිය යුතු ලාභයක් ලබා ගැනීමට අපට හැකි විය.

| | 2019 | 2018 |
|---|---|---|
| ආදායම (රු.මි) | 17,065 | 15,854 |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි) | 2,191 | 1,968 |
| ජයග්‍රාහකයන් සඳහා මුදල් ත්‍යාග | 8,903 | 8,296 |

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී නව ලොතරැයි දිනුම් විකල්ප කිහිපයක් හඳුන්වා දීමත් සමග වෙළඳපොළ කොටස අත්පත් කර ගැනීම සඳහා අනුගමනය කරන ලද තවත් නව්‍ය ක්‍රමෝපායයන් කිහිපයක් තිබුණි.

## අපගේ කැපී පෙනෙන ජයග්‍රහණ

අපගේ ගනුදෙනුකරුවන්ට වැඩි වැඩියෙන් ත්‍යාග මුදල් ලබා දෙන අතරම DLB Sweep App යෙදවුම හරහා අපගේ ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් වර්ධනය කර දීමට ද අපිට හැකි විය. පරිශීලකයින්ට මෙම යෙදවුම සතියේ සියලු දිනවල පැය 24 පුරාම භාවිතා කළ හැකි අතර, එමගින් ඔවුන්ට ජයග්‍රාහී ලොතරැයි පත් පරීක්ෂා කර බැලීමට සහ ත්‍යාග මුදල් සඳහා හිමිකම් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. එයට අමතරව දිවයින පුරා නව අලෙවි කුටි 274 ක් ස්ථාපනය කරමින් ජනතාවට රැකියා අවස්ථා උදා කර දීමට ද කටුතු කර තිබේ.

ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් තවදුරටත් පුළුල් කිරීමට සැලසුම් කරමින් අපි ලොතරැයි කවුළු 255 ක් අපගේ සන්නාම අලවා සන්නාමනය කර, ලොතරැයි අලෙවි නියෝජිතයින් සඳහා දිස්ත්‍රික්ක 7 ක් ආවරණය වන පරිදි වෛද්‍ය කඳවුරු පවත්වා, වෙනස් හැකියාවන්ගෙන් යුත් අලෙවි සහායකයින් අතර ට්‍රයිසිකල් 63 ක් බෙදා දීම ද සිදු කරන ලදී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අපි අපගේ ව්‍යාපාරය සමාජමය වශයෙන් වගකීම් සහගත ආකාරයකට ක්‍රියාත්මක කරන්නෙමු. සමාජමය වශයෙන් වගකීම් සහගත සහ තිරසාර ව්‍යාපාරික ආයතනයක තත්වය මගින් අපට උපයා දී ඇති දැනුම, පුහුණුව සහ සමාලෝචන ක්‍රියාවලිය අනුගමනය කිරීම සඳහා අප දිරිමත්ව සිටින්නෙමු. වෙළඳපොළෙහි ඇති අපගේ නිෂ්පාදනවල, ප්‍රවර්ධන ද්‍රව්‍යවල සහ වෙළඳ දැන්වීම්වල අපගේ ත්‍යාග දිනා ගැනීමේ පණිවුඩය අන්තර්ගත වන බවට අපි සහතික වෙන අතර එය සමාජමය වශයෙන් වගකීම් සහගත ආකාරකට සමාජය වෙත නැවත දායකත්වයක් සපයා දෙයි. අපි නව්‍ය, පහසු සහ ආකර්ශනීය ලොතරැයි නිෂ්පාදන සපයා දෙමින් අඛණ්ඩව ම අපගේ ගනුදෙනුකරුවන් සහ අලෙවිකරුවන් කෙරෙහි අවධානය යොමු කර සිටින්නෙමු.

මෙම වර්ෂයේ අපගේ අරමුණු ඉටු කර ගැනීම අප වෙත සහයෝගය දැක්වූ අතිගරු ජනාධිපතිතුමාට සහ ගරු මුදල් අමාත්‍යතුමාටත්, කාර්යක්ෂමව තම කාර්යභාරයන් ඉටුකරමින් කටයුතු කළ අපගේ කාර්ය මණ්ඩලයටත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අවංක ස්තූතිය පිරිනමමි. ඔවුන් උසස් තත්ත්වයේ නිෂ්පාදන වෙළඳපොළට සපයා දීම පමණක් නොව, ආයතනික සමාජ වගකීම් රාමුවක් තුළ පාර්භෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම ද සහතික කර තිබේ.



**රවීන්ද්‍ර ජේ විමලවීර**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2019

**එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
2017.09.14 සිට 2019.11.21 දක්වා

**එච්.ආර්. විමලසිරි මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
2017.09.14 සිට 2019.11.22 දක්වා

**එච්.සී.ඩී.එල්. සිල්වා මහතා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 01.

අධ්‍යක්ෂ
2017.09.26 දින සිට 2020.01.10 දක්වා

**ඩී.එන්. නානායක්කාර මහතා,**
ජනාධිපති අතිරේක ලේකම්,
ලේකම්, ජනාධිපති අරමුදල,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අධ්‍යක්ෂ
2017.10.10 සිට 2019.12.02 දක්වා

**එම්.පී. බණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර
අරමුදල

අධ්‍යක්ෂ
2019.01.28 සිට 2019.12.02 දක්වා

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

**එච්.පී. සුමනසිංහ මහතා**
සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
(වැඩබලන)
අතිරේක ලේකම්, මුදල් අමාත්‍යාංශය

**ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
ලේකම්, වෙළඳ අමාත්‍යාංශය

**රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා**
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
ප්‍රධාන මූල්‍ය නිලධාරී, ජනාධිපති ලේකම්
කාර්යාලය

**නීතිඥ ජැනට් ජයවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ.
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# 2019.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය

| තනතුර | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| සභාපති / ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන) | | 1 | 1 | | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | | 1 | | 1 | |
| සාමාන්‍යාධිකාරී | H.M - 2.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) | H.M - 1.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | H.M - 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) | M.M-1.1 | 2 | 2 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | M.M- 1.1 | 3 | 2 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | M.M- 1.1 | 2 | 1 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමාකරණ/පරිපාලන) | M.M- 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) | M.M- 1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණය) | M.M- 1.1 | 1 | 1 | | |
| අභ්‍යන්තර විගණක | M.M- 1.1 | 1 | 1 | | |
| පරිපාලන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රවාහන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| කලාප කළමනාකරු | J.M- 1.1 | 10 | 10 | | |
| මුදල් නිලධාරී | J.M- 1.1 | 4 | 4 | | |
| පද්ධති සහ වැඩසටහන් විශ්ලේෂක | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රසම්පාදන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| මානව සම්පත් නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| විකුණුම් ප්‍රවර්ධන සහකාර | MA - 3 | 24 | 16 | 8 | |
| තත්ත්ව පාලන සහකාර | MA - 3 | 1 | | 1 | |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA - 3 | 4 | 2 | 2 | |
| මාධ්‍ය සහ මහජන සම්බන්ධතා සහකාර | MA-3 | 1 | 1 | | |
| මූල්‍ය සහකාර | M.A-2.2 | 2 | 0 | 2 | |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | MA-1.2 | 1 | 1 | | |
| පිරිස් සහකාර | MA-1.2 | 1 | 1 | | |
| කළමනාකරණ සහකාර | MA-1.2 | 137 | 129 | 8 | |
| විකුණුම් සම්බන්ධීකාරක | MA-1.1 | 5 | 3 | 2 | |
| රියදුරු | P.L - 3 | 43 | 43 | | |
| විදුලි කාර්මික | P.L -3 | 2 | 2 | | |
| කාර්යාල කාර්ය සහායක | P.L -1 | 65 | 60 | 5 | |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | P.L -1 | 10 | 9 | 1 | |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | P.L -1 | 6 | 1 | 5 | |
| ආරක්ෂක සහකාර | P.L -1 | 3 | 15 | | 12 |
| **එකතුව** | | **342** | **317** | **37** | **12** |

# කළමනාකරණ කණ්ඩායම

01 **එච්.ජී. සුමනසිංහ මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)

02 **ඩබ්ලිව්.කේ.ඒ.ඒ. ජයරත්න මහතා**
සාමාන්‍යාධිකාරී

03 **ඩබ්ලිව්.ඒ.වී.සී. සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

04 **ඩී.ඩී.සී. දමින්ද මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

05 **කපිල බුලත්සිංහල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

06 **අසංකා එස්. ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

07 **ටී. කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

08 **නිශාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

09 **කේ.ජී. සුනිල් ජයරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)

10 **කේ.ආර්.ආර්. ප්‍රසාද් රණසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමණාකරණ/පරිපාලන)

11 **පී.බී. මධුර හර්ෂණ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

12 **එස්.එම්.ඒ. වසන්ත උදය කුමාර මහතා**
අභ්‍යන්තර විගණක

13 **පී.ඩී.යු. මලින්ද මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)

# කනිෂ්ඨ කළමනාකරුවන්

01 ඊ.ඩී.අයි.එන්.එස්. අබේරත්න මහතා
පරිපාලන නිලධාරී

02 ජේ.එම්.ඩී.ඒ. ක්‍රිෂාන්ත මහතා
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

03 ජී. රොෂාන් ප්‍රියන්ත මහතා
කලාප කළමනාකරු

04 සී. සී. අයිලප්පෙරුම මහතා
කලාප කළමනාකරු

05 එම්.බී.එම්.එන්.කේ. බලගල්ල මහතා
කලාප කළමනාකරු

06 පී.ඒ.ආර්.එස්. රණතුංග මහතා
කලාප කළමනාකරු

07 එම්.කේ.ඒ.අයි. කමල්සිරි මහතා
කලාප කළමනාකරු

08 අයි.ඩී. පත්ම කුමාරසිරි මහතා
කලාප කළමනාකරු

09 ඩී.එම්.බී.එල්. මහින්ද මහතා
කලාප කළමනාකරු

10 එම්.එල්. ගෞරි කෞශල්‍යා මහත්මිය
කලාප කළමනාකරු

11 ආර්.ඒ. සුනිල් රත්නායක මහතා
කලාප කළමනාකරු

12 ආර්.එම්.යූ.එස්. කුමාර මහතා
කලාප කළමනාකරු

13 එන්.වී. ඉන්දික උපුල් මහතා
ගිණුම් නිලධාරී

14 ආර්.ඩී.සී. රාජපක්ෂ මහත්මිය
ගිණුම් නිලධාරී

15 එම්.ඒ.එල්.එන්. ගුණසේකර මහත්මිය
ගිණුම් නිලධාරී

16 ආර්.ඒ.ඩබ්ලිව්.පී. රූපසිංහ මහත්මිය
ගිණුම් නිලධාරී

17 යූ.පී. ඉලේපෙරුම මහතා
පද්ධති විශ්ලේෂක / වැඩසටහන් විශ්ලේෂක

18 බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා
ප්‍රසම්පාදන නිලධාරී

19 සී. එන්. තෙවරප්පෙරුම මහත්මිය
මානව සම්පත් නිලධාරී

20 පී. ප්‍රසන්න ගෝකුල ප්‍රනාන්දු මහතා
ප්‍රවාහන නිලධාරී

21 පී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය
අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී

# මෙහෙයුම් සමාලෝචනය

## 2019 වර්ෂයේ අලෙවි කටයුතු පිළිබඳ විශේෂ කරුණු

2019 වසර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි කටයුතු විධිමත් ලෙස සැලසුම් කර අලෙවිකරණ කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක වූ වසරක් ලෙස හැඳින්විය හැක. මෙම වසර තුළ ඉහළ මට්ටමින් ඵලදායි ලෙස ක්‍රියාත්මක වීම හේතුකොට ගෙන ජනාධිපති අරමුදලට විශාල මුදල් ප්‍රමාණයක් බැර කිරීමටත්, ත්‍යාග වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් ජයග්‍රාහකයින්ට ලබා දීමටත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

2019 වර්ෂයේදී සංවර්ධන ලොතරැ යි මණ්ඩලයේ පහත ක්‍රියාදාමයන් තුළින් අලෙවිකරණ කටයුතු වර්ධනය කර ගැනීමට හැකි විය..

## 01. ප්‍රවර්ධන වැඩසටහන්

### • ශනිදා වාසනාව

ශනිදා වාසනාව ලොතරැයිපත නව මුහුණුවරකින් වෙළඳපළට හඳුන්වා දීම වෙනුවෙන් 3255 වන දිනුම් වාරය සඳහා **2019 ඔක්තෝම්බර් 30 (බදාදා)** වන දින විශේෂ දිනුම් ඇදීමක් සිදු කරන ලදී. මෙම විශේෂ දිනුම් ඇදීමේ දිනයේදී ලොතරැ යිපත් මිලියන 2.2 අළෙවියක් සිදු කරන ලදී. මීට සමගාමීව 2019 නොවැම්බර් 1 වන දා සිට 2020 ජනවාරි 31 වන දා දක්වා (Mini Draw) දිනුම් ඇදීම් මාලාවක් සිදු කරන ලදී.

එමෙන්ම 2019 මාර්තු 29 (බදාදා) 3166 වන දිනුම් ඇදීමේ වාරය වෙනුවෙන් විශේෂ දිනුම් ඇදීමක් සිදු කරන ලද අතර එහිදී 2.1 ක ලොතරැයිපත් අලෙවියක් සහ **2019 පෙබරවාරි 23 (සෙනසුරාදා)** වන දින 3152 දිනුම් වාරයේදී ද විශේෂ දිනුම් ඇදීමක් සිදු කරන ලද අතර එහිදී මිලියන 2.2 ක ලොතරැයිපත් අලෙවියක් සිදු කර ඇත.

### • ලග්න වාසනා

ලග්න වාසනාව ලොතරැයි පතට ඇති ඉහළ ඉල්ලුම හේතුකොට ගෙන **2019 ජනවාරි 17 (බ්‍රහස්පතින්දා)** වන දින සිට ලග්න වාසනාව බ්‍රහස්පතින්දා දින හඳුන්වා දුන් අතර ඒ සමඟම අංක 2ක් සඳහා ත්‍යාග මුදල් ලෙස රු.100 ක් ලබා දීම ද වෙනස් විය. **2019 අගෝස්තු 03 (සෙනසුරාදා)** වන දින සිට ලග්න වාසනාව සෙනසුරාදා දිනයන්හිදී සහ **2019 අගොස්තු 05 (සඳුදා)** වන දින සිට ලග්න වාසනාව සඳුදා දිනයන්හිදී දිනුම් ඇදීම ආරම්භ කරන ලදී. මෙම වෙනස්වීමත් සමගම **2019 අගෝස්තු 01** වන දින සිට ලග්න වාසනාව ලොතරැයි පත සතියේ දින 07 ම දිනුම් ඇදීම සිදු කරන ලදී. ලග්න වාසනාව දින සතියේ දින 07 ම දිනුම් ඇදීම සිදු කිරීම ආරම්භ කරන ලද්දේ, **"ඩබල් චාන්ස්"** නමින් මාසයක ප්‍රවර්ධන වැඩසටහන සමඟිනි.

ලග්න වාසනාව සන්නම් නාමය ප්‍රවර්ධනය කිරීම සහ දින සතියේ දින 07 ම දිනුම් ඇදීම වෙනුවෙන් **2019 අගෝස්තු 31 (සෙනසුරාදා)** වන දින, **"ලග්න වාසනා සුපිරි ධන යෝගය"** නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලද අතර එහිදී ලොතරැයිපත් **මිලියන 1.8** ක අලෙවියක් සිදු කරන ලදී.

### • කෝටිපති කප්රුක

**2019 අප්‍රේල් 09 (අඟහරුවාදා)** වන දින **"කෝටිපති අවුරුද්ද"** නමින් විශේෂ දිනුම් ඇදීමක් කෝටිපති ශනිදා ලොතරැ යිපත සඳහා පවත්වන ලදී. මෙම විශේෂ දිනුම් ඇදීමේදී ලොතරැයිපත් මිලියන 2.1 ක අලෙවියක් සිදු කරන ලදී.අලෙවිය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් **2019 ජූලි 30 (අඟහරුවාදා)** වන දින **"වින් ඇන්ඩ් ඩ්‍රයිව්"** නමින් විශේෂ දිනුම් ඇදීමේ වාරයක් පවත්වන ලද අතර එදින මිලියන 2.2 ක ලොතරැයිපත් අලෙවියක් වාර්තා විය.

කෝටිපති ශනිදා ලොතරැයිපත නව මුහුණුවරකින් ජනතාවට ගෙන ඒමේ අරමුණින් **"කෝටිපති කප්රුක"** නමින් නව ලාංඡනයක් සහ ආකර්ෂණීය වර්ණ (රෝස, කොළ සහ කහ) සහිතව **2019 අගෝස්තු 02 (සිකුරාදා)** වන දින සිට වෙළඳපලට නිකුත් කරන ලදී. මීට සමගාමීව 2019 අගෝස්තු 2 වන දා සිට 2020 ඔක්තෝම්බර් 29 වන දා දක්වා **"වාසි දහස"** නමින් (Mini Draw) දිනුම් ඇදීම් මාලාවක් සිදු කරන ලදී.

එමෙන්ම තවදුරටත් අලෙවිය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් **2019 නොවැම්බර් 29 (සිකුරාදා)** වන දින **"කාර් & කෑෂ්"** නමින් විශේෂ දිනුම් ඇදීමේ වාරයක් පවත්වන ලද අතර එදින මිලියන 2.1 ක ලොතරැ යිපත් අලෙවියක් වාර්තා විය.

### • නියත ජය

**2019 ජූලි 30 වැනි (අඟහරුවාදා)** වන දින සිට බල පැවැත්වෙන පරිදි වෙළඳපලින් ඉවත් කරන ලදී.

### • ජයෝදා

ජයෝදා ටිකට් පත්වල දිනුම් ඇදීම් අදින ලද්දේ සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනයන්වල අතර **2019 අගෝස්තු 05** වන දින සිට සඳුදා දින අඟහරුවාදා දිනට මාරු විය.

### • සුපර් බෝල්

සුපර් බෝල් ලොතරැයිය කෙරෙහි ඇති ඉහළ පාරිභෝගික ඉල්ලුම හේතුකොට ගෙන **2019 ජනවාරි 27** වන දින සිට ඉරිදා දිනයන්හිදී ද දිනුම් ඇදීම ආරම්භ කරන ලද අතර එම දිනයේ සිට ආරම්භක ජයමල්ල **කෝටි 4 සිට කෝටි 5** දක්වා ඉහළ නංවන ලදී.

### • සංවර්ධන වාසනා

සංවර්ධන වාසනාව ටිකට් පත්වල දිනුම් ඇදීම් අදින ලද්දේ බදාදා සහ සෙනසුරාදා දිනයන්වල අතර **2019 අගෝස්තු 02** වන දින සිට සෙනසුරාදා දින වෙනුවට සිකුරාදා දිනට දිනුම් ඇදීමේ දිනය මාරු කරන ලදී.

### • අද කෝටිපති

**2019 ජුනි 28 (සිකුරාදා)** වන දින **"අද විශේෂ කෝටිපති"** නමින් විශේෂ දිනුම් ඇදීමේ වාරයක් පවත්වන ලද අතර එදින මිලියන 1.8ක ලොතරැයිපත් අලෙවියක් වාර්තා විය. එමෙන්ම **2019 ඔක්තෝම්බර් 01 (අඟහරුවාදා)** වන දිනද **"අද විශේෂ කෝටිපති"** නමින් විශේෂ දිනුම් ඇදීමේ වාරයක් පවත්වන ලද අතර එදින මිලියන 2.14ක ලොතරැයිපත් අලෙවියක් වාර්තා විය.

අද කෝටිපති ටිකට් පතේ අලෙවිය තව දුරටත් වර්ධනය කර ගැනීමේ අදහසින් යුතුව බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන් දිරිගැන්වීම සඳහා ජූලි, අගෝස්තු, සැප්තැම්බර් මාසවල ඉහළම විකුණුම් ප්‍රමානයක් පෙන්නුම් කරන බෙදාහැරීමේ

අලෙවි නියෝජිත හට බැංකොක් සවාරියක් ලබා දෙන ලදී.

එමෙන්ම 2019 අගෝස්තු 01 වන දින සිට ඔක්තෝම්බර් 31 වන දක්වා අද කෝටිපති ප්‍රධාන දිනුම් ඇදීමට අමතරව **"සල්ලි සීසන්"** නමින් (Mini Draw) දිනුම් ඇදීමක් සිදු කරන ලදී.

- **ක්ෂණික ලොතරැයි**

ක්ෂණික ලොතරැයි අලෙවිය ඉහළ නැංවීමේ අරමුණෙන් 2019 වර්ෂයේදී **"සිහින කැදැල්ල/සිරි නිවස"** නමින් ක්ෂණික ලොතරැයිපතක් වෙළඳපලට ඉදිරිපත් කළ අතර ත්‍යාග මුදල් ලෙස ගෘහ භාණ්ඩ කට්ටල ලබා දෙන ලදී.

## 02. 2019 වර්ෂය සඳහා නව බෙදාහැරීමේ නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් පත් කිරීම

| දිස්ත්‍රික්කයේ අංකය | දිස්ත්‍රික්කය | අලෙවි බෙදාහරින්නන් | අලෙවි නියෝජිතයින් |
|---|---|---|---|
| 01 | කොළඹ | | 17 |
| 02 | කළුතර | | 06 |
| 03 | නුවර | | 09 |
| 04 | මාතලේ | 02 | 01 |
| 05 | නුවරඑළිය | | 01 |
| 06 | ගාල්ල | | 05 |
| 07 | මාතර | | 02 |
| 09 | යාපනය | | 00 |
| 10 | මන්නාරම | | 00 |
| 12 | මඩකලපුව | | 01 |
| 13 | අම්පාර | 01 | 00 |
| 14 | ත්‍රිකුණාමලය | 01 | 00 |
| 15 | කුරුණෑගල | | 06 |
| 16 | පුත්තලම | | 03 |
| 17 | අනුරාධපුර | | 00 |
| 19 | බදුල්ල | | 00 |
| 20 | මොණරාගල | | 01 |
| 21 | රත්නපුර | | 03 |
| 22 | කෑගල්ල | | 07 |
| 23 | ගම්පහ | | 08 |
| 24 | හම්බන්තොට | | 03 |
| 25 | පොළොන්නරුව | | 01 |
| 26 | මුලතිව් | | 01 |
| | | 04 | 78 |

## 03. "DLB අභිමාන" අලෙවිය නියෝජිත හමුව

2019 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයෙහි අලෙවි නියෝජිත හමුවක් සංවිධානය කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

## 04. අලෙවි නියෝජිතයන් සහ අලෙවි සහයකයින් සඳහා වූ විශේෂ වැඩසටහන්

- අලෙවිය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද **"500 outlet Project" ව්‍යාපෘතිය** යටතේ නව අලෙවි කුටි 226ක් ලබාදීම 2018 වර්ෂය තුළ සිදුකළ අතර ඉතිරි අලෙවි කුටි 274 ක ප්‍රමාණයක් 2019 වර්ෂයේදී තවදුරටත් බෙදා දීම සිදුකර ඇත. එහිදී එක් අලෙවි කුටියක වටිනාකම රු.43000 ක් වූ අතර ඒ සඳහා 2019 වර්ෂයේදී රු.11782000 ක මුදලක් වැය කර ඇත.
- එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසාන වීමත් සමග නැවතත් අලෙවි නියෝජිත මහත්ම මහත්මීන් සඳහා අලෙවි කුටි 250 ක් බෙදාදීමේ වැඩසටහනක් ආරම්භ කළ අතර එහිදී බෙදාදුන් එක් අලෙවි කුටියක වටිනාකම රු.46000 ක් විය. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ සමස්ත මුදල රු.11500000 කි.
- 2019 වර්ෂයේදී අලෙවි කුටි ස්ටිකර් කිරීම සඳහා එක් අලෙවි කුටියකට රු.15,000 බැගින් අලෙවි කුටි 255 කට රු.3,825,000ක් වැය කරන ලදී.
- 2019 වර්ෂයේදී දිවයින පුරා අලෙවි කුටි 46ක් ස්ටිකර් කිරීම සඳහා සම්පූර්ණ අනුග්‍රහය සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන ලදී.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දිවයින පුරා අලෙවි නියෝජිතයින්හට "Lottery Shops" තනා ගැනීම සඳහා අනුග්‍රාහකත්වය ලබාදීමේ වැඩසටහනක් 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙලෙස 2019 වර්ෂයේ ද දිවයින පුරා "Lottery Shops" සඳහා දායකත්වය ලබා දීමට හැකි විය.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතවරුන් යටතේ සිටින අලෙවි සහයකයින් සඳහා වෛද්‍යාධාර සහ අනෙකුත් මූල්‍යමය අවශ්‍යතාවයන් සඳහා රු.10,000ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ලබා දීමේ වැඩ පිළිවෙලක් 2018 වර්ෂයේදී ආරම්භ කළ අතර එම වැඩසටහන තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීම 2019 දීත් සිදුකරන ලදී.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහයකයින් වෙනුවෙන් දීප ව්‍යාප්තව වෛද්‍ය සායනයන මාලාවක් **"DLB සත්කාර"** නමින් පැවැත්වීම 2018 වර්ෂයේදී ආරම්භ කළ අතර එය තවදුරටත් ක්‍රියාත්මක කර ඉදිරියට ගෙනයාම 2019 දීත් සිදුවිය. ඒ අනුව

2019 වර්ෂයේදී අම්පාර, නුවරඑළිය, බදුල්ල, ගාල්ල, හම්බන්තොට, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි වෛද්‍ය කඳවුරු ක්‍රියාත්මක කළ අතර එහිදී නොමිලේ වෛද්‍ය පරීක්ෂණ, රසායනාගාර පරීක්ෂණ, ඖෂධ සහ ඇස්කණ්නාඩි ලබාදීම සිදුවිය.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිත මහත්ම මහත්මීන්ගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන දූදරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනෙහි දෙවන අදියර 2019 වර්ෂයේදී ක්‍රියාත්මන කළ අතර එය 2019.03.08 දින සංවර්ධන ලොතරැයි මණ්ඩල ශ්‍රවණාගාරයේදී සිදුකරන ලදී. මසකට රු.1500 බැගින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් වන තෙක් ලබා දෙන එම පූර්ණ කාලීන ශිෂ්‍යත්වය දූ දරුවන් 25 දෙනෙක් සඳහා ප්‍රදානය කරන ලදී.

- දිවයින පුරා සිටින ආබාධිත අලෙවි සහයකයින්හට "Tricycle" ලබා දීමේ වැඩසටහන 2018 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ආරම්භ කල අතර එම වැඩසටහන තවදුරටත් ඉදිරියට කර ගෙන යාම 2019 වර්ෂයේදීත් සිදුකකරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී ආබාධිත අලෙවි සහයකයින් 63 දෙනෙක් සඳහා ට්‍රයිසිකල් බෙදාදීම සිදුකරන ලදී.

- 2019 වර්ෂයේ පැවති සුමති සම්මාන උළලේදී 2019 වසරේ හොඳම රූපවාහිනී වෙළඳ දැන්වීමට හිමි ලෝකඩ සම්මානය දිනා ගැනීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලග්න වාසනාව ලොතරැයි පත වෙනුවෙන් නිර්මාණය කරන ලද වෙළඳ දැන්වීමකට අවස්ථාව හිමිවීම.

## 05. අනුග්‍රාහකත්වයන් සහ දායකත්වයන්

- ත්‍රිපිටකය ලෝක උරුමයක් බවට පත් කිරීමේ ජාතික උත්සවය සඳහා 2019.03.19 දින රු.1000000 ක අනුග්‍රාහකත්වයක් ලබාදීම.

- 2019 ජූලි මස 24,25,26 සහ 27 යන දිනයන්හි අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩාංගණයෙහි පැවති එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු.15,000,000 ක අනුග්‍රාහක දායකත්වයක් ලබා දෙන ලදී.

- 2019 සැප්තැම්බර් මස 07,08,09,10 යන දිනයන්හිදී යාපනය Mutral Veli හි පැවැත්වූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන සඳහාද රු.15,000,000 ක අනුග්‍රාහක දායකත්වයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ලබාදෙන ලදී

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සන්නාමය සහිත උද්‍යාන කුඩ බෙදාදීමේ වැඩසටහනෙහි තවත් අවස්ථාවක් 2019 වර්ෂයේදීද ක්‍රියාත්මක කළ අතර එය 2019.03.29 දින කළුතර බෝධිය අසල මල් විකුණන පිරිසක් වෙනුවෙන් ලබා දෙන ලදී.

- 2019 වර්ෂයේ රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර වෙනුවෙන් රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2019 වර්ෂයේ මහනුවර දළදා පෙරහැර වෙනුවෙන් රු. 250,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

## 06. විශේෂ වැඩසටහන්.

- 2019 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දිවයින පුරා දැන්වීම් පුවරු 26ක් රු.23,353,845ක වියදමක් දරා ස්ථාපිත කරන ලදී.

- නව තාක්ෂණික ප්‍රවණතාවයන්ට අනුගත වෙමින් අනාගත ව්‍යාපාරික ලෝකය ජය ගැනීම සඳහා DLB Sweep App එළිදැක්වීම 2019.10.10 දින සිදුකිරිම

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වැඩිම ආරම්භක සුපිරි ජයමල්ල වන කෝටි 7.5 ක ජයමල්ලක් සහිත කෝටිපති කප්රුක ලොතරැයියේ 513 වන වාරයේ සුපිරි ජයමල්ල වූ රු. 14,50,29,213 ක අති දැවැන්ත ජයමල්ල දිනා ගැනීමට 2019.10.27 වන ඉරිදා දින රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල ප්‍රදේශයේ වාසනාවන්තයෙක් සමත් වීම.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වසර විස්සක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක මහත්ම මහත්මීන් අගය කරමින් ඔවුන් වෙත රන් පවුම බැගින් ලබාදීම 2019.08.28 දින සිදු කිරීම.

# අපගේ නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණයක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල හරහා අධ්‍යාපනය සහ ප්‍රජා ව්‍යාපාර සඳහා අරමුදල් සපයා දෙයි. මණ්ඩලය සුරන ලොතරැයි සහ දිනුම් ඇදීමේ ලොතරැයි වශයෙන් ලොතරැයි වර්ග දෙකක් හඳුන්වා දෙයි.

- **දිනුම් ඇදීමේ ලොතරැයි** - යන්ත්‍රයක් මගින් දිනුම් අදිනු ලබන අංක සමග ලොතරැයි පතේ ඇති අංක ගැළපීම මගින් මෙම දිනුම් ඇදීම සිදු කරනු ලැබේ.
- **සුරන ලොතරැයි -** පූර්වයෙන් තීරණය කරන ලද ත්‍යාග තිබේද යන්න හෙළි කර ගැනීම සඳහා කඩදාසි ලොතරැයි පතෙහි ඇති ක්ෂීර ස්තරය සූරා ඉවත් කිරීම මගින් දිනුම් ඇදීම කරනු ලැබේ.
- **සන්නාම ලැයිස්තුව**

සඳුදා / බදාදා / සෙනසුරාදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා /සෙනසුරාදා ඉරිදා

සඳුදා / බ්‍රහස්පතින්දා

අඟහරුවාදා / සිකුරාදා

සඳුදා / බ්‍රස්පතින්දා සෙනසුරාදා / ඉරිදා

බදාදා / සිකුරාදා

අඟහරුවාදා / සිකුරාදා / ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා /සෙනසුරාදා ඉරිදා

## 01. අද කෝටිපති




- **සන්නාම දැක්ම**

  වෙළඳපොළ ප්‍රමුඛයා වීම සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත් වීම

- **සන්නාම මෙහෙවර**

  අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීබව වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දිනහතම)
  ලොතරැයි වර්ණ : රතු, තද නිල්, කොළ, දම්, තැඹිලි, රෝස, සහ ලා නිල්
  ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 50,000,000/-
  තරගය: ඉලක්කම් 04/75, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 1,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 50,000,000.00 |

## 02. ශනිදා වාසනාව




- **සන්නාම දැක්ම**

  බදාදා, සෙනසුරාදා සහ සඳුදා යන දිනවල අන්තර්ජාල නොවන ලොතරැයි දිනුම් ඇදීම මගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනයක් බවට පත් වීම

- **සන්නාම මෙහෙවර**

  ශ්‍රී ලංකාව තුළ බදාදා, සෙනසුරාදා සහ සඳාදා ප්‍රමුඛ සන්නාමයක් ලෙස අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම හරහා මණ්ඩලයේ ලාභදායීබව වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : බදාදා, සෙනසුරාදා සහ සඳුදා
  ලොතරැයි වර්ණ : දම්, කොළ සහ නිල්
  ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 30,000,000
  තරගය : ඉලක්කම් 04/75, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 60.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 30,000,000.00 |

## 03.කෝටිපති කප්රුක



- **සන්නාම දැක්ම**

  සුපිරි ජයමල්ල ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයි සන්නාමය බවට පත්වීම.

- **සන්නාම මෙහෙවර**

  සුපිරි ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව ප්‍රියකරන ලොතරැයි නිෂ්පාදන තෝරා ගැනීම බවට පත් වීම.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා
  ලොතරැයි වර්ණ : රෝස, කොළ සහ කහ
  ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 75,000,000
  තරගය : ඉලක්කම් 04/75, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 60.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 75,000,000.00 |

## 04. ලග්න වාසනාව



- **සන්නාම දැක්ම**

  ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීමග

- **සන්නාම මෙහෙවර**

  ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ බලාපොරොත්තුව වූ ලොතරැයි නිෂ්පාදනය.

- **තරග විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දිනහතම)
  ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, නිල්, ලා නිල්, දම්
  ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 2,000,000
  තරගය : ඉලක්කම් 04/62, ලග්න සංකේත 1/12

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම ලග්න සංකේතයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 1,000.00 |
| අංක හතර | රු. 5,000,000.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක එකක් | රු. 60.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක දෙකක් | රු. 200.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක තුනක් | රු. 10,000.00 |
| ලග්න සංකේතය සමග අංක හතර | රු. 2,000,000.00 |

## 05. සුපර් බෝල්




- **සන්නාම දැක්ම**

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම

- **සන්නාම මෙහෙවර**

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා, බ්‍රහස්පතින්දා, සෙනසුරාදා සහ ඉරිදා
ලොතරැයි වර්ණ : දම්, කොළ, නිල් සහ රතු
ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 50,000,000
තරගය : ඉලක්කම් 04/77, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 50,000,000.00 |

## 06. සංවර්ධන වාසනාව




- **සන්නාම දැක්ම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී, විශ්වාසනීය සහ ගෞරවනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින්, දිනුම් අදින දින දෙකෙහි ම ජනප්‍රිතම නිෂ්පාදනයක් බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයක් පිරිනමමින්, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම අන්තර්ජාල නොවන ලොතරැයිය බවට පත්වීම.

- **ක්‍රීඩාවේ විස්තර**

දිනුම් ඇදීමේ දින : බදාදා, සිකුරාදා
ලොතරැයි වර්ණ : නිල් සහ රතු
ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 10,000,000/-
තරගය : ඉලක්කම් 03/70, දෛව අංක 01/09, ඉංග්‍රීසි අකුරු 1/26

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| දෛව අංකය | රු. 20.00 |
| ඉංග්‍රීසි අකුර | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 50,000.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක දෙකක් | රු. 500.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක තුනක් | රු. 500,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 500.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| දෛව අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක එකක් | රු. 200.00 |
| දෛව අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක දෙකක් | රු. 10,000.00 |
| දෛව අංකය සහ ඉංග්‍රීසි අකුර සමග අංක තුනක් | රු.10,000,000.00 |

## 07. ජයෝදා




### සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල ජනප්‍රිතම ලොතරැයි නිෂ්පාදනය බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් පිරිනමමින්, සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### තරග විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා
ලොතරැයි වර්ණ : කහ සහ තැඹිලි
ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 20,000,000
තරගය : ඉලක්කම් 04/70, ඉංග්‍රීසි අකුරු 1/26

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 50,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 20,000,000.00 |

## 08. නියත ජය




### සන්නාම දැක්ම

මුදලට වටිනාකමක් පිරිනමමින්, මතකයේ ඉහළින්ම කියවෙන සහ පාරිභෝගිකයන් වඩාත් ප්‍රියකරන ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### තරග විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා සහ සිකුරාදා
ලොතරැයි වර්ණ : තැඹිලි සහ නිල්
ආරම්භක සුපිරි ත්‍යාගය : රුපියල් මිලියන 30
තරගය : ඉලක්කම් 04/65, ඉංග්‍රීසි අකුරු 1/26

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඉංග්‍රීසි අකුර සඳහා | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 1,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 50,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 10,000,000.00 |

## 9. ගැලැක්සි ස්ටාර්




- **සන්නාම දැක්ම**

ඉරිදා දිනයේ දිනුම් අදිනු ලබන අන්තර්ජාල නොවන දිනුම් ඇදීම හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දෙමින්, ඉරිදා දිනවල ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නොවන ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්වීම.

- **තරග විස්තර**

දිනුම් ඇදීමේ දින : ඉරිදා
ලොතරැයි වර්ණ : කහ
ආරම්භක සුපිරි ත්‍යාගය : රු. 2,000,000/-
තරගය : ඉලක්කම් 04/60, තාරකා අංක 1/12

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| තාරකා අංකය | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 40.00 |
| ඕනෑම අංක තුනක් | රු. 1,000.00 |
| අංක හතර | රු. 500,000.00 |
| තාරකා අංකය සමග ඕනෑම අංක එකක් | රු. 60.00 |
| තාරකා අංකය සමග ඕනෑම අංක දෙකක් | රු. 200.00 |
| තාරකා අංකය සමග ඕනෑම අංක තුනක් | රු. 10,000. 00 |
| තාරකා අංකය සමග අංක හතර | රු. 2,000,000.00 |

## 10. DASA LAKSHAPATHI




- **සන්නාම දැක්ම**

අන්තර්ජාල නොවන දිනුම් ඇදීම හරහා ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රියතම ලොතරැයිය බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

නවීනතම තාක්ෂණය යොදාගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දෙමින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

- **තරග විස්තර**

දිනුම් ඇදීමේ දින : බදාදා
ලොතරැයි වර්ණ : කොළ, රතු සහ කහ
ආරම්භක සුපිරි ත්‍යාගය : අලුත් ම කාර් රථයක්
තරගය : ඉලක්කම් 03/55, ඉංග්‍රීසි අකුරු 1/26, අංක 01/07

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 200.00 |
| ඕනෑම අංක තුනක් | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක තුනක් සහ වාසනාවන්ත දවස | රු. 2,500,000.00 මෝටර් රථය |

## 11. ක්ෂණික දිනුම් ලොතරැයිය

- **හැඳින්වීම**

  ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ක්ෂණික ලොතරැයියක් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. වෙළඳපොළට හඳුන්වා දෙන විට එය මෙරටට නව සංකල්පයක් විය.

- **සන්නාම දැක්ම**

  අන්තර්ජාල නොවන ක්ෂණික දිනුම් ලොතරැයිය හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

- **සන්නාම මෙහෙවර**

  මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් සහ නව මුහුණුවරක් හඳුන්වා දෙමින්, ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්වීම.

- **තරඟකාරී පසුබිම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙළඳපොළට ක්ෂණික ලොතරැයි හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලදී: සෙවන සහ සමෘද්ධි මෙම ලොතරැයි දෙක විය.

සෙවන ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික සූරන ලොතරැයිවල සෘජු තරඟකරුවෙක් විය. සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනම ආයතනයක් ස්ථාපනය කරන ලදී. එම නිසා ජනතාව එය මෙරට තිබෙන එකම ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනය ලෙස හඳුනාගෙන තිබුණි.



# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

"සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර, එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි."

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක තුනක කාලය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මූලික වශයෙයෙන් ම තිරසාර ව්‍යාපාරික ආයතනයක් වී තිබේ. ආරම්භයේ සිටම සංවර්ධන ලොතරැයි මණ්ඩලය හුදෙක් එහි ආසන්නතම පාර්ශවකරුවන්ගේ ශුභසිද්ධියට වඩා වැඩි යමක් සැලකිල්ලට ගනිමින් තරඟකාරී ව්‍යාපාර ක්‍රමෝපාය සකස් කිරීම සමාජයේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමග නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. සමාගමේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපාය මාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සමාජ වගකීමට ව්‍යාපාරයේ, පාරිභෝගිකයින්ගේ සහ ලොතරැයි ජයග්‍රාහකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමර්ග මෙන් ම ප්‍රජා සත්කාර වැඩසටහන් ද ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට ප්‍රතිවර්ණය වෙයි.

## අපගේ මූලික සාරධර්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය තෝරා ගෙන ඇති ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක් සමග කැපවීම, විශ්වාසනීයත්වය සහ නිර්දේශනය ලබා දීම සඳහා මණ්ඩලයට පැහැදිලි අභිලාෂයක් ඇත. මෙම අභිලාෂය සපුරා ලීම සරල දෙයක් නොවන අතර එය බොහෝ දුරට අපි තිරසාර ආකාරයකට වගකීම් සහගත ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටින බවට සැකයකින් තොරව සනාථ කිරීමට අපිට ඇති හැකියාව මත රඳා පවතියි. අපගේ කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කරන විට, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහත් සේ වෙහෙසෙන්නේ එහෙයිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ටත්වය සහ සාර්ථකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අපි අපගේ සේවක පිරිස සඳහා ආයෝජන කරන්නේ අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි. එමෙන්ම, අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, කර්මාන්තයේ රැකියා නිර්මාණය කිරීම සහ ජනාධිපති අරමුදලට හා මහපොල භාර අරමුදලට දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය රැකවරණය සහ අධ්‍යාපනය වැනි වැදගත් සේවාවන් සපයා දීමට සහාය වීම සඳහා ආදායම වැඩි කර ගැනීමට අරමුණු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සපයා දීමේදී පාරිභෝගිකයින් කෙරෙහි වඩාත් නැඹුරුවී සිටින අතර, සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරනු ලබන ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රයත්නයන්හිදී අප ලබා ගනිමින් සිටින ප්‍රගතිය පිළිබඳ අපි ආඩම්බර වෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා එලදායී ප්‍රජා සහාය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවය වැඩි කිරීමටද අදහස් කරන්නෙමු. මෙම වර්ෂයෙහි වාර්තාව අපගේ සමාජ වගකීම් ප්‍රයත්නයන් පිළිබඳ පාදීය මිනුමක් ලෙස ක්‍රියා කරනු ඇත. මෙම වාර්තාව තුළින් අපි සෑම වර්ෂකදී ම මෙම ක්ෂේත්‍රයන්හි අපි අත් කර ගනිමින් සිටින ප්‍රගතිය පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂය සඳහා අපගේ අරමුණු ද ප්‍රකාශ කරන්නෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ලොතරැයි නිෂ්පාදන හා ත්‍යාග තුළින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට ස්ථාවර හා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැපවූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජ, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර ඇති බව මෙම ක්‍රියාකාරකම් මගින් අවධාරණය කෙරෙයි. තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජන ද සිදු කරයි.

## ආයතනික සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කර ගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අපට අවශ්‍ය ය. එබැවින් අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකා රජයට අරමුදල් සපයා දෙමින්, ප්‍රජා සත්කාර සිදු කිරීම, ප්‍රාදේශීය පුණ්‍යායතන සඳහා සහාය දීම සහ ශ්‍රී ලංකාවේ අපගේ ජනතාවගේ ජීවිත පොහොසත් කිරීම සිදු කරයි. ලොතරැයි අලෙවිකරුවන්ගේ සමස්ත දාමයට ම සහාය සපයා දෙමින් පුද්ගලයින්ගේ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම අරමුණු කර ගත් සමාජ ව්‍යාපාර වැඩසටහන් කිහිපයක් දියත් කිරීමට ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

## සේවා නියුක්තිය සවිබල ගැන්වීම සඳහා අප විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත:

- අපගේ අලෙවිකරුවන් අතර ලොතරැයි කුට් 274 ක් බෙදා දීම
- ලොතරැයි කුට් 255 ක ස්ටිකර් 255 ඇලවීම
- ලොතරැයි අලෙවි සැල් සඳහා අනුග්‍රාහකත්වය සපයා දීම

- ලොතරැයි අලෙවි නියෝජිතයින් සහ සහායකයින් 400 ක් පමණ දෙනාට ප්‍රතිලාභ ලබා දෙමින් වෛද්‍ය කඳවුරක් සංවිධානය කිරීම.
- අලෙවි සහායකයින් අතර ට්‍රයිසිකල් 63 ක් බෙදා දීම

## අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

අලෙවි නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාලවලට ඇතුළු වූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. එවැනි ළමයින් 25 දෙනෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබුණි.

අප සමාජයේ ආර්ථික දුෂ්කරතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම මගින් අපි සිසුන්ගේ ජීවිතවල බලපෑමක් ඇති කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් සපයා දී ඇති ආකාරය පිළිබඳ අපගේ ප්‍රතිලාභීන් ජීවමාන සාක්ෂියක් සපයා දෙයි.

## පාසල්වලට උපකාර කිරීම

මෙම කාලය මුළුල්ලෙහි ම අප සමග සිටි අපගේ සමාජයට ආපසු ප්‍රතිලාභ ලබා දීමේ අපගේ අධිෂ්ඨානය තුළ අපි කිසිවිටෙක අප අවට ඇති පාසල් නොසලකා හැරියේ නැත.

## පන්සල්

පූජනීය ස්ථාන සම්බන්ධයෙන් අපට ඇති වගකීම 2019 වර්ෂයේදී අපි ප්‍රශංසනීය ලෙස ඉටු කළෙමු. අප අවට ඇති සමහර විහාරස්ථාන දෙස බැලීමේදී ඒවායෙහි ඇති කර තිබෙන බලපෑම ඔබට දැක ගත හැකි වනු ඇත.

## සමාජ සේවා

සමාජයේ මෙම අංශයට ද අපි අපට හැකි අයුරින් අපගේ වගකීම ඉටු කර ඇත්තෙමු.

## ආගමික කාර්යයන්

සමාලෝචනයට භාජනය කළ වර්ෂය තුළදී මෙම ආයතන සඳහා ද අපි ද්‍රව්‍යමය හා මූල්‍යමය වශයෙන් දායකත්වය ලබා දුන්නෙමු. ඔවුන් අප වෙත පැමිණි සෑම අවස්ථාවකදී ම අපි ඔවුන් වෙනුවෙන් උපකාර කිරීමට ඉදිරිපත් වුනෙමු.

## ක්‍රීඩා උත්සව

අපි මේ පිළිබඳව දැනුවත්ව සිටින අතර ක්‍රීඩා උත්සව කාල වලදී ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීමට අමතරව මුදලින් ආධාර කිරීම මගින් ද අපි ඉතා වැදගත් දායකත්වයක් ලබා දී ඇත.

## ගම් මට්ටමෙන් සහ දිස්ත්‍රික් මට්ටමෙන් රැස්වීම් කිහිපයක් පැවැත්වීම

අප අවට ප්‍රදේශයේ රැස්වීම් කිහිපයක් පැවැත්වීම මගින් අපි අවට සමාජයෙහි ආයෝජනය කර ඇත. තම ජීවිතයට වඩා හොඳ අරුතක් ලබා ගත හැකි මාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අපගේ ඉලක්කය වේ. ඒ උදෙසා අපි ඉටු කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තා සැමට දැක ගත හැකිය.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේදී අපගේ සේවකයින්ගේ වැදගත් කාර්යභාරය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකා සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනය දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ත්‍යාග ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- සමාගමේ ක්‍රමෝපායික දිශාව පිළිබඳව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත්ව සහ දැන සිටින බව සහතික කිරීම.

## දේශීය පුහුණු වැඩසටහන් (කෙටි කාලීන)

| පුහුණු වැඩසටහන / වැඩමුළුව | සහභාගීවූවන්ගේ නම් | තනතුර | පුහුණු කාල පරිච්ඡේදය | පුහුණු ආයතනය |
|---|---|---|---|---|
| අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලසුම් කිරීම | වසන්ත සේනාධීර මහතා | අභ්‍යන්තර විගණක | දින 01 | ප්‍රාග් පුහුණු ආයතනය |
| රාජ්‍ය ප්‍රසම්පාදනයෙහි අත්‍යවශ්‍යාංග | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | දින 03 | දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය |
| MS-Excel වැඩසටහනෙහි උසස් කාර්යයන් | සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය | විකුණුම් හා අලෙවිකරණ නිලධාරී | | |
| | නිශාන්ත රණවක මහතා | විකුණුම් ප්‍රවර්ධන සහකාර | දින 02 | |
| | චම්මිකා විජේසේකර මහත්මිය<br>ධර්මානි පතිරණ මහත්මිය<br>දිස්නි තරින්ද්‍රා මෙනවිය | කළමනාකරණ සහකාර | | දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය |
| ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු පුහුණුව | සුරංග කෝතලාවල මහතා<br>වරුණ විශ්වජිත් මහතා | කාර්යාල කාර්ය සහකාර | දින 05 | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ප්‍රවාහන කළමනාකරණය | ප්‍රසන්න ගෝකුල මහතා | ප්‍රවාහන කළමනාකරු | දින 02 | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| ව්‍යාපාර සන්නිවේදනය | නිලධාරීන් 35 දෙනෙක් | | දින 01 | DEW ඇසෝසියේට්ස් |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | චමින්ද කරුණාරත්න මහතා<br>මනෝජිතා සංජීවනී මහත්මිය | ප්‍රසම්පාදන නිලධාරී සහකාර | දින 03 | මිලෝදා |
| අලෙවි කණ්ඩායම් අභිප්‍රේරණය කිරීමේ වැඩසටහන | අලෙවි කණ්ඩායම 46 | දින 01 | | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| මුදල් රෙගුලාසි | මූල්‍ය අංශයේ නිලධාරීන් 35 දෙනෙක් | | දින 01 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| කාර්යාල කළමනාකරණය සහ පටිපාටිය | ප්‍රවාහන අංශයේ නිලධාරීන් 37 දෙනෙක් | | දින 01 | ශ්‍රී ලංකා පොලිස් ප්‍රවාහන කොට්ඨාසය |
| විකිණීමේ බලපත්‍රය | රොෂාන් ප්‍රියන්ත මහතා<br>ඉන්දික කමල්සිරි මහතා<br>සුනිල් රත්නායක මහතා | කලාප කළමනාකරු | පැය 22 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය |
| රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රය | මනෝජිතා සංජීවනී මහත්මිය | කළමනාකරණ සහකාර | දින 05 | මිලෝදා |
| තොග ගැනීමේ නිලධාරීන් | වත්සලා රූපසිංහ මහත්මිය<br>රුවන් පෙරේරා මහතා<br>මධුශංක වීරසිංහ මහතා | මුදල් නිලධාරී<br>කළමනාකරණ සහකරුවන් | දින 02 | මිලෝදා |
| ලංසු ලේඛනය සකස් කිරීම | චාමර කටුකෙන්ද මහතා<br>ඉරෝෂා අබේසිරිවර්ධන මහත්මිය | කළමනාකරණ සහකාර | දින 03 | මිලෝදා |
| තොරතුරු පද්ධති විගණනය | ජලිත් පුංචිහේවා මහතා | කළමනාකරණ සහකාර | දින 02 | මිලෝදා |
| ප්‍රසම්පාදන කළමනාකරණය | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| පුද්ගලයින් පුහුණු කිරීම | විකුණුම් ප්‍රවර්ධක සහකාර සහ කළමනාකාර සහකාර 44 දෙනෙක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |
| ගිණුම්කරණ ප්‍රමිති | මූල්‍ය අංශයේ නිලධාරීන් 35 දෙනෙක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |
| විකිණීමේ බලපත්‍රය | උපාලි සමන්කුමාර මහතා<br>මහින්ද දිසානායක මහතා | කලාප කළමනාකරු | පැය 22 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය |
| රාජ්‍ය සේවයේ විනයක්‍රියා පටිපාටි | නුවන් අබේරත්න මහතා | පරිපාලන නිලධාරී | දින 03 | මිලෝදා |
| ව්‍යාපෘති යෝජනා සැලසුම් කිරීම | කපිල බුලත්සිංහල මහතා | සහකාර සාමාන්‍යාධිකාරී | දින 02 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| ඩීසල් විදුලි උත්පාදක යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | ඩී.එන්.එස්.ඒ. රාජපක්ෂ මහතා | විදුලි කාර්මික ශිල්පී | දින 05 | ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය |
| දත්ත විශ්ලේෂණය සහ තීරණ ගැනීම සඳහා Advanced Excel | තිලිණ අමරසිංහ මහතා<br>කෞශල්‍ය වික්‍රමසිංහ මහතා | කළමනාකරණ සහකාර | දින 03 | නිපුණතා සංවර්ධන අරමුදල |
| නව විගණන පනත සහ අභ්‍යන්තර පාලන පද්ධතිය සකස් කිරීම | වසන්ත සේනාධීර මහතා | අභ්‍යන්තර විගණක | දින 02 | නිපුණතා සංවර්ධන අරමුදල |
| චිත්තවේගී බුද්ධිය | ප්‍රසාද් රණසිංහ මහතා | සහකාර සාමාන්‍යාධිකාරී | දින 01 | |
| වරලත් ගණකාධිකාරීවරුන්ගේ 40 වැනි වාර්ෂික සමුළුව | නිෂාන් පෙරේරා මහතා<br>වසන්ත සේනාධීර මහතා | සහකාර සාමාන්‍යාධිකාරී<br>අභ්‍යන්තර විගණක | දින 01 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය |
| වැටුප් පරිවර්තනය | නුවන් අබේරත්න මහතා | පරිපාලන නිලධාරී | දින 02 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| ආදායම් බදු ගණනය කිරීම කඩිනමින් සංශෝධනය කිරීම | සජිත ආටිගල මහතා | කළමනාකරණ සහකාර | දින 03 (දිනකට පැය 4) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය |

| | | | | |
|---|---|---|---|---|
| ජේම්ස් ටේලර් ඇන්ඩ් මාර්කටර්ස් සමුළුව | අසංකා ගුණසිංහ මහත්මිය<br>සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය | සහකාර සාමාන්‍යාධිකාරී<br>විකුණුම් ප්‍රවර්ධන නිලධාරී | දින 02 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය |
| ලේඛන කටයුතු සම්බන්ධ පිළිවෙත් | පූජා හේවාබන්දු මෙනවිය<br>දුලාන් කෝට්ටගේ මහතා | කළමනාකරණ සහකාර | දින 04 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| පුහුණුව සහ සංවර්ධනය | ප්‍රසාද් රණසිංහ මහතා<br>චමිල තෙවරප්පෙරුම මහතා | සහකාර සාමාන්‍යාධිකාරී<br>මානව සම්පත් නිලධාරී | දින 02 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| කාර්ය සාධන ඇගයීම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක සැකසීම | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)<br>සහකාර සාමාන්‍යාධිකාරී - 4<br>කණිෂ්ඨ කළමනාකරු | | දින 01 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| දුරකථන ඇමතුම් නිපුණතා සහ ආචාර රීති පුහුණුව | මනෝජ් අධිකාරි මහතා | කාර්යාල කාර්ය සහායක | දින 02 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| ආයතනික කළමනාකරණය | සන්ධ්‍යා අමරකෝන් මහත්මිය<br>සුසීමා චන්ද්‍රමාලි මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | ප්‍රාග් ආයතනය |
| පාරිභෝගික සේවය | විකුණුම් හා අලෙවිකරණ<br>දෙපාර්තමේන්තුවල නිලධාරීන් 55 ක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |
| කාර්යාල සහායකයන්ගේ කුසලතා සංවර්ධනය | කාර්යාල සහායකයින් 25 දෙනෙක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |
| උසස් MS Excel කුසලතාවය | චතුරි ලසන්ති මහත්මිය | කළමනාකරණ සහකාර | දින 02 | මිලෝදා |
| කාර්යාල උපකරණ පිළිබඳ පාලනය | කළමනාකරණ සහායකයින් 10 දෙනෙක් | | දින 02 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල |
| කාර්ය සාධන ඇගයීම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක සැකසීම | කාර්ය මණ්ඩලය 25 දෙනෙක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |
| කාර්යාල ක්‍රම හා කාර්යක්ෂමතා වර්ධනය | රසිකා වසන්ති මහත්මිය<br>දිල්කි වනිගසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | ප්‍රාග් ආයතනය |
| රියදුරු මහතුන්ගේ කාර්යභාරය සහ වගකීම් | රියදුරු මහතුන් 30 දෙනෙක් | | දින 01 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය |

# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතරම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනයක කරන අතර, තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

සමායතනවල කාර්යභාරයන් සහ වගකීම් නිර්වචනය කෙරෙන නියමයන් සහ ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි වේ:

- ආයතනික පාලන පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩල / විධායක කළමනාකරණ සම්බන්ධතාවය
- ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම්
- ආයතනික උපායමාර්ගික සැලසුම්කරණය
- ආයතනික කාර්ය සාධන කළමනාකරණය
- අභ්‍යන්තර විගණනය
- අධ්‍යක්ෂ මණ්ඩල සහ ප්‍රධාන විධායක නිලධාරී වියදම්
- අවදානම් කළමනාකරණය
- ආයතනික සමාජ වගකීම
- ව්‍යාපාර සැලැස්ම සහ අයවැය අනුමත කිරීම

## අධ්‍යක්ෂ මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධාරී ලෙස සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නායකත්වය ලබා දෙයි. එමෙන් ම ඔහු/ඇය ආයතනය මෙහෙයවයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ඉහළම ස්ථරය වන අතර එය මණ්ඩලයේ මෙහෙයුම් සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම දරයි.

සභාපතිවරයා සහ පත් කළ අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ:

1. ජනාධිපති අරමුදල නියෝජනය කරන අධ්‍යක්ෂවරයා
2. මහපොළ භාර අරමුදල නියෝජනය කරන අධ්‍යක්ෂවරයා
3. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා
4. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු. එම දෙදෙනා අතරින් එක් අයෙකු සභාපතිවරයා වශයෙන් පත් වේ.

## සභාපති/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම්

- ආයතනික පාලනය ස්ථාපිතව තිබෙන බව සහතික කිරීම
- කටයුතු නිසි පරිදි පසු විපරම් කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වල මුලසුන දැරීම.
- අධ්‍යක්ෂවරුන්ට එක හා සමානව සැලකීම සහ ඔවුන්ගේ විශේෂඥ දැනුම සහිත ක්ෂේත්‍රයන්ට උපරිම දායකත්වයක් ලබා දෙමින් ඵලදායී කාර්යභාරයක් ඉටු කිරීමට ඔවුන්ව දිරිමත් කිරීම
- අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කිරීම සහ සභාපතිවරයා ප්‍රධාන විධායක නිලධාරී නොවේ නම් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් වැළකීම
- සමාගමේ ක්‍රියාකාරකම් සමබන්ධයෙන් තීරණ ගැනීමේ පූර්ණ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බවට සහතික කිරීම
- පැහැදිලි ලෙස වගකීම් බෙදීම සහතික කිරීම සහ අධිකාරියෙහි හා බලතල වල සමතුලිතතාවයට පහසුකම් සැලසීම

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස කොටස් හිමියන් වෙත වාර්තා කිරීම.
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.

## අධ්‍යක්ෂ මණ්ඩලය සහ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව - 2019

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම | නොපැමිණීම | කාලය සිට | කාලය දක්වා |
|---|---|---|---|---|---|---|
| 2019.01.29 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති/ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | 2017.09.14 | 2019.11.22 |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | 2017.09.14 | 2019.11.21 |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | 2018.11.23 | 2020.01.10 |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | 2015.03.11 | 2019.12.02 |
| 2019.02.26 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | 2019.01.28 | 2019.12.02 |
| 2019.03.28 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| 2019.04.30 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | | ☑ | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| 2019.05.31 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| 2019.06.27 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායකකක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| 2019.08.05 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්.නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| 2019.09.17 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ | | | |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ | | | |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ | | | |

| | | | |
|---|---|---|---|
| 2019.09.26 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| 2019.10.29 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| 2019.11.14 | එස්.ඒ.පී. සූරියප්පෙරුම මහතා | සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | ☑ |
| | එච්.ආර්. විමලසිරි මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | ☑ |
| | එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ඩී.එන්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | පරාක්‍රම බණ්ඩර මහතා | අධ්‍යක්ෂ | ☑ |

- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකකූලව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මකව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන හා කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. සේවක මණ්ඩල සුභසාධන කමිටුව
5. ප්‍රචාරණ කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩල සංස්කෘතික හා කලා සංගමය

## අනුකූලතා නිලධාරී

නියාමන හා ව්‍යවස්ථාපිත නියමයන්ට සහ මණ්ඩල පාලන නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කිරීම පිණිස මූල්‍ය අංශ ප්‍රධානී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), විසින් අනුකූලතා නිලධාරියාව නියෝජනය කරනු ලබයි.

## කළමණාකාරීත්වය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හදුනා ගනු ලබන බව සහ නියමිත වේලාවට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

එලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම්ව සිටින අවදානම් මට්ටම් ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහගත ප්‍රවේශයක් සංවර්ධන ලොතරැයි අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ගය විශේෂිත පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාර සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියමකර ගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ:

## ත්‍යාග ගෙවීමේ අවදානම

සෑම තොග මට්ටමකදී ම ත්‍යාගවල සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. අවදානම විය හැක්කේ මුදල් ප්‍රවාහයට බලපෑ හැකි සිදුවීම් ඇතිවීමේ හැකියාව නිසා වැඩි මිල අනුපාතයක් තිබිය හැකි වීමයි. ඉහත සඳහන් කළ අවදානම ආවරණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුද්‍රණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනියි.

## ආර්ථික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන් රටෙහි පවතින සමාජ-ආර්ථික හා දේශපාලන වෙනස්කම් වල අනුබලය මත පදනම් වේ.

## මූල්‍ය අවදානම්

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ලාභදායීත්වයට හා එලදායීතාවයට හානි ගෙන දිය හැකියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිසි රක්ෂණ ආවරණයක් සහතික කිරීම සහ ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

## ද්‍රවශීලතා අවදානම

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් උපයා ගැනීම මගින් ද්‍රවශීලතා අවදානම් ඇති විය හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ මුදල් වත්කම් පවත්වාගෙන යයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නුබුන්වත් වුව ද, මණ්ඩලය ගෙවීමට බැඳී සිටින ගෙවීම් ගෙවිය යුතු අවස්ථාව වන විට ඒවා ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් සම්පත් පවත්වාගෙන යාමට හෝ උත්පාදනය කිරීමට නොහැකි නම්, හෝ එසේ ගෙවීමට හැක්කේ සැලකිය යුතු ලෙස අවාසිදායක තත්ත්වයන් යටතේ පමණක් නම් ද්‍රවශීලතා අවදානම් පැන නගියි.

## මෙහෙයුම් අවදානම

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදු විය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්වයන් මගින් පාර්භෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක, ව්‍යාපාර ක්‍රියාවලි සහ මහා පරිමාණ ඒකක පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

## ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම උපායමාර්ගික සහ/හෝ කීර්තිනාම හේතූන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ඇති විය හැකි ආදායම් හිඟයට අදාළ වේ. අනෙකුත් අමතර කරුණු අතර, බාහිර සාර්ව ආර්ථික පරිසරය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෝරාගනු ලබන උපායමාර්ගය සහ මණ්ඩලය ක්‍රියාත්මක වන වෙළඳපොළ තුළ එයට ඇති කීර්තිනාමය මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

## කීර්තිනාම අවදානම

පාර්ශ්වකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානි සිදු වීම හේතුවෙන් කීර්තිනාම අවදානම ඇති විය හැකි අතර, එමගින් ව්‍යාපාර රඳවා තබා ගැනීමට සහ උත්පාදනය කිරීමට ඇති හැකියාව අඩපණ කරයි. විශ්වාසය, පැහැදීම හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය බිඳවැටීමෙන් එවැනි හානියක් සිදුවිය හැකිය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දෘශ්‍ය මාධ්‍ය සහ මහජන බැඳියාව මත විශ්වාසය තබා සිටීම මගින් මණ්ඩලය සැලකිය යුතු කීර්තිනාම පාඩු අවදානමකට ලක් වෙයි. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජන බැඳියාව රඳවා ගැනීම සඳහා එලදායී අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර දැඩි පද්ධතික විනිවිදභාවයක් අනුගමනය කරමින් කටයුතු කරයි.

## නීති අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගත නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිළිගත් නීති වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

## තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා (03) ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| 1. එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති |
| 2. ඩී.එන්. නානායක්කාර මහතා | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික |
| 3. එම්.පී. බණ්ඩාර මහතා | විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික |

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්, අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්යභාරය

පාර්ශ්වකරුවන්ගේ බැඳියාව සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම් වලට අදාළව සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිවයන්, විනිශ්චයකිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

2. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව වරින් වර සිදු කරන ලද අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

2. අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

## පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2019 වර්ෂය සඳහා රැස්වීම් පහක් (05) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත සඳහන් පරිදි වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | පැමිණීම | නොපැමිණීම |
|---|---|---|
| එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | 05/05 | නැත |
| ඩී.එන්. නානායක්කාර මහතා | 05/05 | නැත |
| එම්.පී. බණ්ඩාර මහතා | 05/05 | නැත |



**එච්.සී.ඩී.එල්. සිල්වා**
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව

# මූල්‍ය වාර්තා



## පටුන

### මූල්‍ය වාර්තා


ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව |42

කළමනාකරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග |54

විස්තීර්ණ අදායම් ප්‍රකාශය |64

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය |65

මුදල් ප්‍රවාහ ප්‍රකාශය |66

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය |67

ගිණුම්කරණ ප්‍රතිපත්ති |68

කාණ්ඩ වාර්තාව |72

අවසාන ගිණුම් සඳහා සටහන් |74

දස වසරක සාරාංශය |86

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } [illegible] | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2020 අගෝස්තු 26 දින

සභාපති
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

ආපදා ණය වාරික ලැබීම් රු.15,075,390 ක් හා ආපදා ණය ගෙවීම් රු.29,515,488 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන් වශයෙන් නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගලපා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2019 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව සෙරීගෙන යන වැඩ ලෙස සහ අත්තිකාරම් ලෙස දක්වා ඇති පිළිවෙලින් රු.1,583,595 ක මුදලක් හා රු.2,074,958 ක මුදලක් 2014 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් වන අතර ඒවා අත්හිටුවන ලද ඉදිකිරීම් සඳහා දරන ලද වියදම් විය. එම වටිනාකම් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකර වසර 05 ක් තිස්සේ තවදුරටත් ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. තවද අත්හරින ලද ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබූ තවත් රු.1,325,805 ක මුදල දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගතකර තිබුණු අතර අදාල වටිනාකම් වත්කම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි, එම නිසා එම වටිනාකමින් වත්කම් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) මණ්ඩලයට අයිති නොමැති ඉඩමක ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් දරණ ලද රු.492,392 ක මුදලක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද එම මුදල තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස නිරීක්ෂණය විය. එනිසා දේපළ පිරියත හා උපකරණ වටිනාකම වැඩිපුර දැක්වුණු අතර ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කර නොතිබුණු කාර්යයක් වෙනුවෙන් 2020 වර්ෂයේ දී දරන ලද රු.1,421,842 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ සෙරීගෙන යන වැඩ සහ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි,

(ඈ) මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන අවසන් තොගය තුළ වටිනාකම රු.2,853,172 ක් වූ ප්‍රයෝජනයට ගත නොහැකි තොග ඇතුළත් වී තිබූ නිසා අවසන් තොගය එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි.

(ඉ) ප්‍රචාරණ රථයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතුව පැවති රු.1,315,300 ක මුදලක් ගිණුම්ගත නොකර ඇති අතර එම වටිනාකමින් දේපළ පිරියත හා උපකරණ සහ ගෙවිය යුතු වියදම් ගිණුම්වල ශේෂයන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.732,951 ක් වූ පෙර වර්ෂවල විකුණිපත් මුද්‍රණ වියදම් ගිණුම් ශේෂය සම්බන්ධයෙන් අදාළ තහවුරු කිරීමේ සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ සුදුසුකම් සහිත මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL



## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමින් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ

මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයනු ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයනු ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලද

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

NAOSL ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE



- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.2 (අ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති රීති/විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (VIII) පරිච්ඡේදයේ 4.1 ඡේදය | - ක්ෂේත්‍ර නිලධාරීන් අතිකාල ගෙවීම සඳහා හිමිකමක් නොමැති නිලධාරීන් ලෙස දක්වා තිබුණද මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් හට සමාලෝචිත වර්ෂයේදී රු.1,122,318 ක් වූ අතිකාල දීමනා ගෙවා තිබුණි.<br>- මාණ්ඩලික නිලධාරීන්ට 1/20 දීමනාව ලබාගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දිනකට පැය 08 ක් අනිවාර්යයෙන්ම රාජකාරි කල යුතු වුවත් මණ්ඩලය විසින් මෙම විධිවිධාන නොසලකා නිවාඩු දිනවල මාණ්ඩලික නිලධාරීන් වැඩකල පැය ගණන මත පැයට පැය එකහමාරක් බැගින් |

අනුයාතිකව අතිකාල දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. තවද එම දිනවලදීම මාණ්ඩලික නිලධාරීන් දිනුම් ඇදීමේ කාර්යය සඳහා සහභාගී වී එම දීමනාවද ලබාගෙන තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) මුදල් රෙගුලාසි 272 (3)

- සියලුම ගෙවුම් වවුචර් ඒවාට අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොවැඩි කාලයක් ඇතුළත්වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර්පත් විගණනයට ඉදිරිපත් කිරීමේදී මාස 1 ත් 7 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

(ii) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ)

- එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම පත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 20 කදී උපරිම සීමාව ඉක්මවා රු.3,481,827 ක් අග්‍රිම ලබාදී තිබුණි.
- මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රිම ලබාදිය යුතු වුවත් 2019 වර්ෂය තුළදී වටිනාකම රු.10,727,741 ක් වූ අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන්ට ලබාදී තිබුණි.
- පත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීමේදී එම කාර්යයන්ට අදාල ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 219 කදී රු.1,680,806 ක ඉතිරිවීම් වාර්තා වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371 (2) (ඇ)

- එම නිශ්චිත කාර්යයන් සඳහා ලබාගන්නා ලද අත්තිකාරම් එකී කාර්ය නිමවූ විගසම පියවිය යුතු වුවද 2019 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා අවස්ථා 12 කදී රු.650,500 ක අත්තිකාරම් දින 18 ත් 47 ත් අතර කාලපරාසයක් තුළ පියවීම් ප්‍රමාද කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4/2018 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1.1 ඡේදය | - | මණ්ඩලය සතු සියළුම වාහන තක්සේරු කළයුතු වුවත් රු.8,958,763 ක් වටිනා යතුරු පැදි 44 ක් හා 2009 වර්ෂයේදී රු.7,882,371 කට මිලදීගන්නා ලද හයිබ්‍රිඩ් වර්ගයේ මෝටර් රථයක් සඳහා තක්සේරු වටිනාකම ලබාගෙන නොතිබුණි. |
| 1.3.3 ඡේදය | - | විධිවිධාන ප්‍රකාරව වාහන කාණ්ඩ 3 කට වර්ග කර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂක නිලධාරියකු සහ මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු ඇතුළත්ව ආයතන ප්‍රධානියා විසින් පත්කරන ලද තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් වාහන තක්සේරු කළ යුතු විය. එහෙත් එසේ කටයුතු නොකර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවා ගෙන තිබුණි. |
| (ii) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදයේ (අ) වගන්තිය | - | විධිවිධාන ප්‍රකාරව යම්කිසි වාහනයකට ලියාපදිංචි අයිතිය, ආයතනයේ නමට නොපවතින අවස්ථාවක එවැනි වාහනවල අයිතිය ආයතනය වෙත ලියාපදිංචි කිරීමෙන් අනතුරුව පමණක් අපහරණ ක්‍රියාවලිය සිදුකළ යුතුය. නමුත් අලෙවි නියෝජිතයකුට ලබාදීම සඳහා 2013 වර්ෂයේදී රු.411,500 කට මිලදී ගෙන තිබූ ත්‍රීරෝද රථය ලියාපදිංචි කිරීමකින් තොරව 2017 ජුලි මාසය දක්වා මුළු කාලයේ තබා ඇති අතර පසුව මණ්ඩලය |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

8

ටවුන් ගෙනාවින් භාරදී තිබුණි. එය අංක වන තෙක් ලියාපදිංචි කර නොතිබුණු අතර 2020 ජූනි 29 දින අපහරණය කිරීම සඳහා ලංසු කැඳවා තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පරිදි මණ්ඩලයේ බලතල, කාර්යයන් සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවක් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන ප්‍රමාදයන්

2018 වර්ෂයේදී රු.5,565,000 කට මිලදීගන්නා ලද Rear body රහිත Double Wheel කැබ් රථය අලෙවි ප්‍රවර්ධන රථයක් ලෙස සකස් කිරීමට 2018 ඔක්තෝබර් 18 දින U-Sri ආයතනයට භාරදී ඇති අතර 2020 ජූනි 30 දින වන විට වසර 1 යි මාස 08 ක් ගතවී ඇති නමුත් සිදුකර තිබුණේ ලොරි බොඩියේ හැඩිල්ල සාදා පිටත ආවරණ යෙදීම හා පසු පස කොටසේ දොරවල් සවිකිරීම පමණි. ප්‍රවර්ධන අලෙවි රථයක් මිලදීගැනීම සඳහා රු.මිලියන 10.2 ක ප්‍රතිපාදන තිබියදී, ලොතරැයිපත් ප්‍රවාහනය කිරීම සඳහා මිලදීගත් වාහනයක් මෙලෙස හදිසියේම අලෙවි රථයක් ලෙස සකස් කිරීමට තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතරයන් සකස් කර මිල ගණන් කැඳවා තිබූ අතර 2009 අංක 8 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ 6 (1) වගන්තියේ විධිවිධානවලට පටහැනිව රථයේ ප්‍රමාණයද වෙනස් කර තිබුණි. තවද මෙම කාර්ය සඳහා මිලදීගන්නා ලද භාණ්ඩවල වසරක් සඳහා වූ වගකීම් කාලයෙන් මාස 8 ක් අවසාන වී තිබීම, එන්ජිම හා එහි උපාංගවල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම, වාහනය ලියාපදිංචි කිරීමේ අවදානමක් පැවතීම හා කාර්ය සාධන ඇපකරවල වලංගුකාලයද ඉක්මවා ගොස් තිබීම යනාදී කරුණු මත රු.12,670,000 ක වැයක් දැරීමට යෝජිත මෙම ගමනාගමන කටයුත්ත මූල්‍ය ප්‍රකාශනවල නියමිත ගිණුම්වලින් හෙළිදරව් කිරීමේ ප්‍රශ්නගත බවක් විගණනයේදී නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL



(ආ) ලොතරැයි මුද්‍රණ ආයතන තෝරාගැනීම

(i) 2013 ජනවාරි 02 දිනැති අංක 01/2013 හා 2017 ඔක්තෝබර් 09 දිනැති අංක 4 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ, 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.6.7, 7.7.1 (ඇ), 795 (ඇ), 796 (ආ) (iii), 8.5.1 (අ) හා (ආ) මාර්ගෝපදේශ සහ 2008 දෙසැම්බර් 17 දිනැති අංක අප/08/2356/306/145/TBR දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය යනාදී විධිවිධාන ප්‍රකාරව සැපයුම්කරුවන් තෝරාගත යුතු වුවත් ලොතරැයි මුද්‍රණ ආයතන තෝරාගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණු අවස්ථා විය. අවස්ථා කීපයක් පහත දැක්වේ.

- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව ප්‍රසම්පාදන නිර්ණායක ඇතුළත් කර ප්‍රසම්පාදන ලේඛන යකැස් කිරීම හේතුවෙන් මණ්ඩලයට වාසිදායක මුද්‍රණ ආයතන ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත් වීම.
- අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්ණායකවලට අනුකූල නොවූ ආයතනද ලංසු ඇගයීම් සඳහා තෝරාගැනීම.
- ප්‍රතිචාර දක්වා නොමැති ලංසුකරුවන් ඇගයීම් සඳහා තෝරාගැනීම.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5, 8.5.1 (අ) (ආ) (ඇ) (ඈ) විධිවිධාන සැලකිල්ලට නොගෙන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අභියාචනා ලංසුකරුවන් වෙත දැනුම්දීම, අභියාචනා සඳහා ප්‍රමාණවත් කාලයක් ලබානොදීම හා අභියාචනා ප්‍රතික්ෂේප කිරීම.

(iii) මණ්ඩලයේ සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු විය. මෙම විෂය භාරව කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) හා සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් මුද්‍රණ දෝෂයන් පිළිබඳ දැනුවත් වී සිටියදී, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් දෝෂ නොමැති බව වාර්තා කිරීම හා සැපයුම්කරුවන් දෙදෙනෙකු පිළිබඳව යැවීමකට සත්‍යය හැකි බව වාර්තා කර තිබීම.

(iv) 2018 මාර්තු 25 දින දිනුම් අදින ලද ගොවිසෙත් යනිදා 271 වැනි දිනුම් වාරයට නියමිත ලොතරැයිපත්වල වැරදි කාඩය රටාවක් මුද්‍රණය කිරීම මත රු.320,000ක් අතිරික්ත ත්‍යාග මුදලක් ගෙවීමට මණ්ඩලයට සිදුවී තිබීම, ගිවිසුම් ප්‍රකාරව අදාල මුද්‍රණ ආයතනයෙන් අයකරගත යුතු රු.320,000 ක මුදල අයකරගෙන නොතිබීම සහ වැරදි දත්තයක් මුද්‍රණය කිරීම හේතුවෙන් අයකරගත යුතු රු.500,000 ක මුදලද අයකර නොගැනීම.

(v) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන පාර්ශවය විසින්ම අභියාචනා කැඳවීම සඳහා අසාර්ථක ලංසුකරුවන්ට දැනුම්දීමේ ලිපි යොමුකිරීම, අභියාචනා මණ්ඩලය වශයෙන් කටයුතු කරන ඒකාබද්ධ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කර තිබීම සහ එම කමිටුවේ තීරණය මත යළිත් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අනුමැතිය ලබාදීම් යනාදී කටයුතුද සිදුකර තිබීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳව විගණනයේදී ප්‍රශ්නගත වීම.

(ඇ) **ත්‍යාග මිලදී ගැනීම**

(i) සුපර්බෝල් විශේෂ ලොතරැයියේ ත්‍යාග ලෙස ලබාදීමට තීරණය කර තිබූ ජංගම දුරකථන 20 ක් සඳහා රු.672,860 ක මුදලක් වෙන්කර තිබුණු අතර මෙම මිලදීගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව සිදුකර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 පරිච්ඡේදයේ (ආ) වගන්තිය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් අද ශෝර්ට්පති විශේෂ දිනුම් වාරය සඳහා රු.1,669,500 ක් වටිනා යතුරුපැදි මිලදී ගැනීමේදී ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඈ) **පානීය ජල බෝතල් මිලදී ගැනීම. (රු.1,911,663)**

මණ්ඩලය විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පානීය ජල බෝතල් මිලදීගැනීම සඳහා 2016 වර්ෂයේදී ආයතනයක් තෝරාගෙන තිබුණු අතර 2019 වර්ෂයේ විගණිත දිනය දක්වා එම ආයතනයෙන් පමණක් පානීය ජල බෝතල් මිලදී ගනිමින් පැවතුණි.

(ඉ) **ක්ෂණික ලොතරැයිවල අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ටී-ෂර්ට් මිලදී ගැනීම**

ගබඩාවේ ප්‍රමාණවත් තොගය පවතින විට ඒ පිළිබඳ නොසලකා නැවත මිලදීගැනීම් සිදුකර තිබීම, ක්ෂණික ලොතරැයි පැවැත්වීම නිසි අලෙවි සැලැස්මක් අනුව සිදු නොකිරීම සහ මිලදීගත් අලෙවි ප්‍රවර්ධන අයිතම වෙනුවෙන් ක්ෂණික ලොතරැයි මුද්‍රණය කර වෙළඳපොළට ඉදිරිපත් නොකිරීම යනාදී කරුණු හේතුවෙන් ලොතරැයිවල අලෙවි ප්‍රවර්ධනය සඳහා මිලදීගත් රු.9,075,040 ක් වටිනා ටී ෂර්ට් 17,452 ක් නිශ්ක්‍රියව පැවතුණි.

(ඊ) **ගිනි ආරක්ෂක පද්ධතිය මිලදී ගැනීම**

2019 වර්ෂය තුළ මණ්ඩලය විසින් රු.2,357,000 ක් වැයකොට ගිනි ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර ඒ සඳහා අවස්ථා 3 කදී මිල ගණන් කැඳවා තිබුණි. මෙම සැපයුම්කරු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයේ සෘජු මැදිහත්වීමක් සිදුවී නොතිබුණු අතර සැපයුම්කරු තෝරා ගැනීමෙන් පසුව ගිනි නිවීමේ

දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන තිබුනි. ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කල ආයතන වලින් මිල ගණන් කැඳ වූ බවට සාක්ෂි නොවූ අතර මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 2න් එක් ආයතනයක් මෙම කාර්ය සඳහා තෝරාගත් ආයතනයට අනුබද්ධිත සමාගමක් විය. තවද එම ආයතන දෙකම ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කල ආයතන නොවිය.

(උ) **LED Light Board මිලදීගැනීම**

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 හා 2.6 පරිච්ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව විසින් මිලදීගැනීම තීරණය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් රු.1,358,810 ක් වටිනා ඉහත මිලදීගැනීම සිදුකළ යුතු ආයතනය තීරණය කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) පරිච්ඡේදය අනුව රු.500,000 ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ගිවිසුමකට එළඹිය යුතු වුවද මණ්ඩලය විසින් මෙම මිලදී ගැනීම ගිවිසුමකට අනුව සිදුකර නොතිබුණි.

**3. අනෙකුත් වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලැබිය යුතු ගිණුම්**

(අ) ලොතරැයිවල අලෙවිය වර්ධනය කරගැනීම සඳහා තෑග්ග ලෙස ලබාදීමට මිලදීගත් මෝටර් රථ 2 ක් හා යතුරුපැදි 01 ක් ප්‍රදර්ශන රථ ලෙස අලෙවි නියෝජිතයින් වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රදර්ශන කාලසීමාව තුලදී එකී වාහන අනතුරුවලට ලක්වී රු.236,608 ක අලාභ හානි සිදුවී තිබුණි. එකී අලාභය අලෙවි නියෝජිතයින්ගෙන් අයකර ගන්නා බව මණ්ඩලය විසින් විගණනය වෙත එවා තිබූ පිළිතුරේ සඳහන් කර තිබුණද ඉන් රු.177,667 ක් පමණක් ලැබිය යුතු ශේෂය ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, ඉතිරි රු.58,941 ක මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. තවද 2019 වර්ෂය තුලදී රු.12,566 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම මණ්ඩලය විසින් ඒක පාර්ශිකව කඩ කිරීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක මුදල හා වර්ෂයක් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,252,440 ක මුදල යන මුදල්වල එකතුව වන රු.4,976,220 ක් දැනට වසර 15 ක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ලබාගත් ගොඩනැගිල්ලක් වෙනුවෙන් මණ්ඩලය විසින් බාහිර පාර්ශවයකට ලබා දී තිබූ රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් නැවත අයකර දෙන ලෙස ඉල්ලා මණ්ඩලය විසින් අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. එම තීන්දුව අනුව අදාල මුදල නැවත අයකර ගතයුතු වුවද තීන්දුව ලැබී දැනට වසර 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අදාළ කළමනාකාරිත්වය විසින් ගෙන ඇති තීරණ අනුව සාමාන්‍ය ක්‍රමය යටතේ ණයට ටිකට්පත් අලෙවි කිරීමේදී අදාල ණය මුදල ඊට පසුදින පියවිය යුතු අතර එසේ කිරීමට අපොහොසත් වුවහොත් අදාල අලෙවි නියෝජිතට නැවත ටිකට්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය නතර වේ. එහෙත් 2019 දෙසැම්බර් 31 දිනට මාස 08 සිට මාස 27 දක්වා වූ කාලයක සිට අලෙවි නියෝජිතවරුන් 05 දෙනෙකුගෙන් රු.2,660,369 ක මුදලක් හිඟවී පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2018 අගෝස්තු 28 දින සිට සැප්තැම්බර් 01 දින දක්වා මොණරාගල ප්‍රදේශයේ පැවැත්වූ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය වෙනුවෙන් මණ්ඩලය විසින් රු.3,325,821 ක වියදමක් දරා තිබුණු අතර විකුණුම් ඉලක්කයෙන් සියයට 41 ක් වූ රු.4,100,000 ක විකුණුම් ආදායමක් ලබාගෙන තිබුණි. එහෙත් ටිකට්පතක සාමාන්‍ය විකුණුම් වියදම රු.3.50 ක් වුවද මෙම ප්‍රදර්ශන ක්‍රමය තුල ටිකට්පත් විකිණීමේදී එය රු.16.22 ක් දක්වා වැඩිවී තිබුණු බැවින් සාමාන්‍ය අලෙවි ක්‍රියාකාරීත්වය තුළින් උපයන ලාභයට වඩා රු.2,607,000 කින් මණ්ඩලයේ ලාභය අඩු වී තිබුණි.

3.3 **නිෂ්ක්‍රීය හා අවම උපයෝජිත වත්කම්**

අලෙවි ප්‍රවර්ධන කටයුතුවලට සම්බන්ධව සිදුකරන වැඩසටහන්වලදී භාවිතා කිරීම සඳහා දිස්ත්‍රික්කයකට 10 බැගින් කොඩි කණු 250 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,000,000 ක පිරිවැයක් මණ්ඩලය විසින් 2018 වර්ෂය තුල දරා තිබුණි. එසේ මිලදීගත් කොඩි කණු තොගය මණ්ඩලය තුල ඉතා අනාරක්ෂිත ආකාරයට ගබඩාකර තිබුණු අතර මිලදීගත් දින සිට ඒවා කිසිදු අලෙවි ප්‍රවර්ධන වැඩසටහනකට භාවිතා කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

13

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

ප්‍රචාරණ උපක්‍රමයක් ලෙස මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රය තුළ LED දැන්වීම් පුවරු නිර්මාණය කර සවිකිරීමේ කාර්යය සඳහා ආලෝක පුවරු ස්ථාපනකරණය (Artwork and Production) වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු පදනම් කරගෙන රු.952,000 ක මුදලක් අදාළ සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. නමුත් ඇස්තමේන්තුවේ සඳහන් පරිදි එම ස්ථාපනකරණය සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. තවද දැන්වීම් පුවරු සවිකර ඇති ස්ථාන අනුව ඒවා මහජනතාවට පෙනෙන ප්‍රදර්ශනයක් සිදුනොවන බවද නිරීක්ෂණය විය.

3.5 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) පරිගණක ගත පද්ධතින් ස්ථාපිත කිරීම

මණ්ඩලය විසින් ලොතරැයි දිනුම් ඇදීම සඳහා දැනට භාවිත කරන පරිගණක මෘදුකාංග සේවාව පෞද්ගලික සමාගමකින් ලබාගත් එකක් විය. වසරකට එකතුව රු.මිලියන 6.5 ක වැටුප් හා දීමනා ලබන විධායක නිලධාරීන් 04 දෙනෙකු ඇතුළුව එකතුව රු.මිලියන 9 ක වැටුප් හා දීමනා ලබන නිලධාරීන් 08 දෙනෙකු සහිත පරිගණක අංශයක් මණ්ඩලය තුළ ස්ථාපිත කර තිබුණද, මවුන් ලවා පරිගණක සම්බන්ධ එම කටයුත්ත සිදුකර ගෙන නොතිබුණි. 2009 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මෙම පුද්ගලික ආයතනයෙන් ලබාගත් සේවය වෙනුවෙන් රු.130,607,657 ක් ගෙවා තිබුණි.

(ආ) මණ්ඩලය සතු මුදල් බාහිර පාර්ශවයන් අත රඳවා තැබීම

2019 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලපරිච්ඡේදයට අදාලව දින 1 ත් දින 187 ත් අතර කාලයක් තුළ ලොතරැයි බෙදාහරින්නන් විසින් නොපියවා රඳවාගත් මුදල රු.1,638,032,144 ක් විය. අදාල මුදල් කඩිනමින් මණ්ඩලයට ලබා ගැනීම සඳහා කළමනාකරණය විසින් සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# විගණන වාර්තාව 2019 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

| විගණන ගැටළුව - විගණන වාර්තාව 2019 අනුව | කළමනාකාරීත්වයේ ක්‍රියාමාර්ගය |
|---|---|
| **1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**<br>------------------------------------------------<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07<br><br>පිළිවෙළින් රු.15,075,390 ක් සහ රු.29,515,488 ක් වූ ආපදා ණය ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙනම ම පෙන්වීම සිදු නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැළපීම් කර තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**<br>------------------------------<br>(අ) 2019 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් වලට අනුව, ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ සහ අත්තිකාරම් යනුවෙන් සඳහන්ව තිබූ පිළිවෙලින් රු.1,583,595 ක් සහ රු. 2,074,958 ක් වූ මුදල් ප්‍රමාණ 2014 වර්ෂයේ සිට අඛණ්ඩව පැවතී තිබූ, අත්හිටවූ ඉදිකිරීම් වෙනුවෙන් වැය කරන ලද වියදම් වූ, හිග ශේෂයන් විය. එම වටිනාකම් සඳහා ගිණුම්වල අවශ්‍ය කරන සංශෝධන සිදු නොකර, එම වටිනාකම් තවත් වර්ෂ 5 ක කාලයක් ගිණුම්වල ඉදිරියට ගෙන විත් තිබේ. තවද, අත්හැර දමන ලද ඉදිකිරීම් වෙනුවෙන් වැය කරන ලද තවත් රු.1,325,805 ක මුදලක් දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ අතර, එයට අදාළ වටිනාකම වත්කම් ගිණුමෙන් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එම නිසා එකී වත්කම්වල වටිනාකම එම අගයට වැඩිපුර සඳහන් වී තිබුණි. | ගෘහ නිර්මාණ ශිල්පියා විසින් සපයනු ලබන වාස්තු විද්‍යාත්නුකුල ඇඳීමට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නියමිතය. |
| (ආ) මණ්ඩලයට අයත් නොවන ඉඩමක සිදු කරන ලද ඉදිකිරීමක් වෙනුවෙන් වියදම් කරන ලද රු. 492,392 ක මුදල ඉඩම් සහ ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණ ද, එම මුදල තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතුව තිබූ මුදලක් බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම වැඩියෙන් සඳහන් වී තිබුණු අතර, ජංගම වත්කම්වල වටිනාකම අඩුවෙන් සටහන් වී තිබුණි. | මණ්ඩලය විසින් මෙම ගැටළුව විසඳීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර මේ වන තෙක් ඒ පිළිබඳ තීරණයක් ගෙන නැත. කමිටුවේ නිර්දේශ අනුව අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ ආරම්භ කර නොතිබූ කාර්යයක් වෙනුවෙන් 2020 වර්ෂයේදී වියදම් කර තිබූ රු. 1,421,842 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කෙරෙමින් තිබෙන වැඩ සහ ණය හිමියෝ වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබූ අවසන් තොගවල රු. 2,853,172 ක් වටිනා භාවිතා කළ නොහැකි තොග අඩංගු වූ අතර, එහෙයින් අවසන් තොග එයට සමාන අගයකින් වැඩියෙන් පෙන්වා තිබුණි. | • 2020 වර්ෂයේ දී අලෙවි නියෝජිතයින්ගෙන් රු. 29,388/- ක් අයකර ගන්නා ලදී.<br>• රු. 957,296/- පොත් වලින් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත.<br>• රු. 377,441/- දෝෂ සහිත ද්‍රව්‍ය ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකය 2020/10/1671)<br>• නියැදි පරීක්ෂණ සඳහා රු. 5,480/- වෙන් කර තබා ඇත<br>• ත්‍රිරෝද රථය රු. 575,000/- ක වටිනාකමකට තක්සේරු කර බැහැර කර ඇති අතර, එය |

| | |
|---|---|
| | ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීමට පියවර ගෙන තිබේ<br>• රු .17,250/- ක මුදල ඉදිරියේදී උපයෝජනය කරනු ලැබේ.<br>• රු. 921,699/- ක මුදල ඉදිරියේදී පියවීමට නියමිතය. |
| (ඉ) ප්‍රවර්ධන රථයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තවදුරටත් ගෙවීමට ඉතිරිව තිබූ රු. 1,515,300 ක මුදල ගිණුම් ගත කර නොතිබූ අතර, ඒ අනුව, දේපළ, පිරියත සහ උපකරණ සහ ගෙවිය යුතු වියදම් ගිණුම්වල ශේෂය එයට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **1.2.3 විගණනය සඳහා සාක්ෂි නොතිබීම**<br>මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති, පෙර වර්ෂයේ ලොතරැයි පත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් වූ රු. 732,951 ක වියදම් ගිණුම් ශේෂය සම්බන්ධ අදාළ තහවුරු කර ගැනීමේ සාක්ෂි නොතිබීම හේතුවෙන්, එම අයිතම සෑහීමකට පත් විය හැකි ආකාරයකට සහතික කර ගැනීමට හෝ තහවුරු කර ගැනීමට නොහැකි විය.<br>ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව ම විසින් මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ වන මාගේ වගකීම මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම් නැමති ඡේදයෙහි තවදුරටත් විස්තර කර තිබේ. ම විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි මාගේ තත්වාගණනය කළ මතය සපයා දීම සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය වන්නේ යැයි මම විශ්වාස කරමි. | අදාළ ලිපිගොනුව රජයේ විගණනය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ. |
| **2. අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**<br>නීති, රීති/නියෝගවලට යොමුව — විස්තරය<br><br>(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>----------------<br>VIII වැනි පරිච්ඡේදයෙහි 4.1 වැනි වගන්තිය — ක්ෂේත්‍ර නිලධාරීන්ට අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකම් නොමැති බව නියම කර තිබුණි. එසේ වුවද, සමාලෝචනයට භාජනය වූ වර්ෂයේදී මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට රු. 1,122,318 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.<br>ආයතන සංග්‍රහයට අනුව, 1/20 දීමනාව ලබා ගැනීම සඳහා මාණ්ඩලික නිලධාරීන් අනිවාර්යයෙන් දිනකට පැය 08 ක කාලයක් නිල රාජකාරි සිදු කළ යුතු අතර, මෙසේ විධිවිධාන සලසා තිබියදීත්, මණ්ඩලය නිවාඩු දිනවල මාණ්ඩලික නිලධාරීන් වැඩ කළ පැය ගණන අනුව එම නිලධාරීන්ට පැයකට පැය එකහමාරක අනුපාතයට අතිකාල දීමනා ගෙවා තිබුණි. තවද, එම නිලධාරීන් එම දිනවල පවත්වන ලද ලොතරැයි දිනුම් ඇදීම් සඳහා ද සහභාගී වී ඒ සඳහා ගෙවනු ලබන දීමනාව ද ලබා ගෙන තිබුණි. | අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර අනුමැතිය අපේක්ෂාවෙන් සිටිනු ලැබේ.<br><br>2020 සැප්තැම්බර් 01 දින සිට නිවැරදි කර ඇත. |
| | |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | 2020 දී මෙය නිවැරදි කර ඇත. |
| (i) 272(3) වැනි මුදල් රෙගුලාසිය | ගෙවීම් කරන ලද සියලු ම වවුචර් එම වවුචර් වලට අදාළ මාසය අවසන් වී සති 6 කට නොවැඩි කාලයක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය සමාලෝචනයට භාජනය කරන ලද වර්ෂයේ ගෙවීම් වවුචර ඉදිරිපත් කිරීමේදී මාස 1 සිට මාස 7 දක්වා ප්‍රමාදයක් සිදු වී තිබුණි. | |
| (ii) 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 3/2015 මගින් සංශෝධනය කරන ලද පරිදි අංක 371(2)(ආ) වැනි මදල් රෙගුලාසිය | වරකට ලබා දිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාණය රු. 100,000 ක් වුව ද, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අවස්ථා 20 ක දී එම උපරිම සීමාව ඉක්මවා රු. 3,481,827 ක අග්‍රිම ගෙවා තිබුණි.<br><br>අතුරු අග්‍රිම ලබා දිය යුත්තේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් වුව ද, 2019 වර්ෂයේ දී මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට රු. 10,727,741 ක් වටිනා අග්‍රිම ලබා දී තිබුණි.<br><br>තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීමේදී අදාළ කටයුතු සඳහා ඇස්තමේන්තු නිසි ලෙස සකස් කර නොතිබූ බැවින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අවස්ථා 219 ක දී රු. 1,680,806 ක ප්‍රතිපාදන ඉතිරි කිරීම් වාර්තා වී තිබුණි. | මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා 2016.06.26 වැනි දින නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.<br><br>ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් මෙම ගැටළුව නිවැරදි කිරීමට නොහැකි බව සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජයේ විගණනය වෙත දැනුම් දී ඇත. |
| (iii) 371(2)(ඇ) වැනි මුදල් රෙගුලාසිය | නිශ්චිත කාර්යයක් සඳහා ලැබුණු අත්තිකාරම් අදාළ කාර්යයෙහි වැඩ අවසන් වූ වහාම පියවිය යුතු වුවද, 2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ අවස්ථා 12 ක දී රු. 650,500 ක අත්තිකාරම් පියවා ඇත්තේ දින 18 සිට දින 47 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව ය. | මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා 2016.06.26 වැනි දින නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | | |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර චක්‍රලේඛ<br>(i) 2018 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4/2008 දරණ චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සඳහා වූ මාර්ගෝපදේශ.<br>1.1.1 වැනි ඡේදය | මණ්ඩලය සතු සියලුම වාහන තක්සේරු කළ යුතු වුව ද, රු. 8,958,763 ක් වටිනා යතුරු පැදි 44 ක සහ 2009 වර්ෂයේ දී රුපියල් 7,882,371 ක් ගෙවා මිලදී ගෙන තිබූ Hyundai වර්ගයේ කාර් රථයක තක්සේරු කළ වටිනාකම ලබාගෙන නොතිබුණි. | මෝටර් කාර් රථය සහ මෝටර් බයිසිකල් 44 තක්සේරු කිරීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව ඒවා ස්ථාවර වත්කම් යටතට ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 1.3.3 වැනි ඡේදය | විධිවිධානවලට අනුව, වාහන කාණ්ඩ තුනකට වර්ග කළ යුතු අතර, ඉන් පසුව ඒවා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු සහ මණ්ඩලයේ විධායක නිලධාරියෙකු ඇතුළත් වන පරිදි ආයතන ප්‍රධානියා විසින් පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවක් විසින් තක්සේරු කරනු ලැබිය යුතුය. එසේ වුවද, එලෙස කටයුතු නොකර එම වාහන තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරනු ලැබ ඇත. | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව එය මීළඟ තක්සේරුවේදී නිවැරදි කරනු ලැබේ. |
| 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයෙහි 9 වැනි ඡේදයේ (අ) වගන්තිය | විධිවිධානවලට අනුව වාහනයක් බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු කළ යුත්තේ එම වාහනයෙහි අයිතිය ආයතනයේ නමින් ලියාපදිංචි කර නොමැති නම් එම වාහනය එසේ ආයතනයේ නමට ලියාපදිංචි කිරීමෙන් පසුව පමණි. කෙසේ වෙතත්, 2013 වර්ෂයේ දී අලෙවි නියෝජිතයෙකුට ලබා දීම සඳහා රු. 411,500 ක් ගෙවා මිල දී ගෙන තිබූ ත්‍රිරෝද රථය ලියාපදිංචි නොකර 2017 ජූලි මාසය දක්වා ඔහුගේ භාරයේ තබා තිබී ඉන් පසුව එය මණ්ඩලයට භාර දී ඇත. එය තවමත් ලියාපදිංචි කර නොතිබූ අතර, 2020 ජුනි 29 වැනි දින එය බැහැර කිරීම සඳහා ලංසු කැඳවා තිබුණි.. | 2020.08.26 දින ත්‍රිරෝද රථය සංවර්ධන ලොතරැයි මණ්ඩලය නමින් ලියාපදිංචි කරන ලද අතර එය 2016.08.28 වැනි දින රු. 575,000/- ක වටිනාකමකට බැහැර කරන ලදී. |
| ප්‍රසම්පාදන ප්‍රමාදයන්<br>------------------------------<br>2018 වර්ෂයේ දී රු. 5,565,000 ක මුදලකට මිලදී ගෙන තිබූ පසු පස බඳ රහිත, ද්විත්ව රෝද සහිත crew cab රථය ප්‍රවර්ධන වාහනයක් ලෙස සකස් කිරීම සඳහා 2018 ඔක්තෝබර් 18 වැනි දින U-Sri ආයතනයට භාර දී ඇත. 2020 ජුනි 30 දින වන විට වසර එකකුත් (1) මාස 8 ක කාලයක් ගතවී තිබුණ ද, ඒ දක්වා සිදු කර තිබුණු කාර්යයන් වූයේ එම ලොරියෙහි බඳ සඳහා වන | | වීඩියෝ තිරය සකස් කිරීම නිම කෙරෙමින් පවතින අතර එය 2020 නොවැම්බර මාසයේදී ලියාපදිංචි කිරීමට අපේක්ෂා කෙරේ. |

| | |
|---|---|
| රාමුව සෑදීම, පිටත ආවරණය යෙදීම සහ පසුපස දොරවල් සවි කිරීම පමණකි. අලෙවි ප්‍රවර්ධන රථයක් මිලදී ගැනීම සඳහා මිලියන 10.2 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණ ද, ලොතරැයි පත් ප්‍රවාහනය කිරීම සඳහා මිලදී ගෙන තිබූ වාහනයක් හදිසියේ ම අලෙවි ප්‍රවර්ධන රථයක් බවට පත් කිරීමට තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.6 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතර සකස් කර ලංසු කැඳවා තිබුණු අතර, 2019 අංක 08 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතෙහි 6 (1) වැනි වගන්තියෙහි සඳහන් විධිවිධානවලට පටහැනිව වාහනයේ ප්‍රමාණය ද වෙනස් කර තිබුණි. ඒ අනුව, මෙම කාර්යය සඳහා මිල දී ගත් භාණ්ඩවල වසරක වගකීම් කාලයෙන් මාස 08 ක කාලයක් ඉකුත්වී තිබීම, වත්කම සහ එහි සංරචකවල සුරැකුම පිළිබඳ නොසැලකිල්ල, වාහනය ලියාපදිංචි කිරීම සම්බන්ධ අවදානම සහ කාර්ය සාධන සුරැකුමෙහි වලංගු කාලය ඉකුත්වී යාම යන කරුණු හේතුවෙන් රු. 12,670,000 ක පිරිවැයක් දැරීමට යෝජනා කර ඇති ඉහත සඳහන් මෙහෙයුම් ක්‍රියාකාරකම මූල්‍ය ප්‍රකාශනවල නියමිත ගිණුම් වලින් හෙළිදරව් කර ගැනීම ගැටළු සහගත බව විගණනය විසින් නිරීක්ෂණය කරන ලදී. | |
| (ආ) ලොතරැයි මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණාලය තෝරා ගැනීම<br><br>(i) 2013 ජනවාරි 02 දිනැති අංක 01/2013 සහ 2017 ඔක්තෝබර් 09 දිනැති අංක 04 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛවල සඳහන් විධිවිධාන, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වල 7.6.7, 7.7.1(අ), 795(ඇ) 7.9.6(ආ)(iii), 8.5.1(අ) සහ (ආ) යන මාර්ගෝපදේශ සහ 2008 දෙසැම්බර් 17 දිනැති අංක අප/145/306/2356/08TRB දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් තෝරා ගැනීම සිදු කළ යුතු වුවත්, ලොතරැයි පත් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණාලය තෝරා ගැනීමේදී එසේ කටයුතු කර නොතිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත සඳහන් පරිදි වේ:<br>- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ප්‍රසම්පාදන නිර්ණායක ඇතුළු ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම හේතුවෙන් මණ්ඩලයට වාසිදායක වන මුද්‍රණ සමාගම් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අත්හැරීම.<br>- ලංසු ඇගයීම සඳහා අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සකස් කර ඇති නිර්ණායක වලට අනුකූල නොවන ආයතන තෝරා ගැනීම.<br>- ප්‍රතිචාර දක්වා නොතිබූ ලංසුකරුවන් තෝරා ගැනීම.<br><br>(ii) අභියාචනා සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදෙමින් සහ අභියාචනා ප්‍රතික්ෂේප කරමින්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 8.5, 8.5.1(අ), (ආ), (ඇ), සහ (ඈ) යන මාර්ගෝපදේශවල සඳහන් විධිවිධාන නොසලකා හැර අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අභියාචනා ලංසුකරුවන් වෙත දැනුම් දීම.<br><br>(iii) මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකි. මෙම විෂය භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) මුද්‍රණ දෝෂ පිළිබඳව දැනුවත්ව සිටියදීත්, මුද්‍රණ ක්‍රියාවලියේ කිසිදු දෝෂයක් නොමැති බවත්, සැපයුම්කරුවන් දෙදෙනා ගැන කමිටුවට සෑහීමකට පත් විය හැකි බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව සිය වාර්තාවෙහි වාර්තා කර තිබීම. | තාක්ෂණික ඇගයීම් කමිටුව (2020/2021) විසින් මුද්‍රණාලය තෝරා ගැනීමේ නිර්ණායක සමාලෝචනය කිරීමට පියවර ගෙන ඇති අතර මීළඟ ටෙන්ඩරයේ සිට එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| (iv) 2018 මාර්තු 25 දින දිනුම් අදින ලද කෝටිපති ශානිදා ලොතරැයියේ 271 දිනුම් ඇදීමට අදාළ ලොතරැයි ටිකට් පත් වල වැරදි ත්‍යාග රටාවක් මුද්‍රණය කිරීම හේතුවෙන් මණ්ඩලය විසින් රු. 320,000 ක අමතර ත්‍යාගයක් ගෙවීම, ගිවිසුමට අනුව අදාළ මුද්‍රණ සමාගමෙන් රු. 320,000 ක මුදල අයකර ගැනීමට අපොහොසත් වීම සහ වැරදි දත්ත මුද්‍රණය කිරීම නිසා රු. 500,000 ක මුදලක් අය කර ගැනීමට අපොහොසත් වීම.<br><br>(v) අභියාචනා කැඳවීම සඳහා අසාර්ථක ලංසුකරුවන්ට දැනුම් දීමේ ලිපි යවා තිබූ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා වූ පාර්ශවය, අභියාචනා මණ්ඩලය ලෙස කටයුතු කරන ලද ඒකාබද්ධ කමිටුවේ සභාපතිවරයා ලෙස සේවය කර තිබීම සහ එම කමිටුවේ තීරණය පරිදි කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානය කිරීම අනුමත කර තිබීම. ඒ අනුව විගණනයේදී මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සැක සහිත විය. | රු. 320,000/- ක මූල්‍ය අලාභයක් සිදුවී නොමැති බව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රජයේ විගණනය වෙත දැනුම් දී ඇත. කෙසේ වෙතත්, ටිකට් පතෙහි මුද්‍රණ දෝෂයක් තිබුණි. වෙළඳපොළට නිකුත් කිරීමට පෙර ලොතරැයි පතෙහි වෙනස පරීක්ෂා කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තත්ත්ව කමිටුවක් පත් කරන ලදී. |
| (ඇ) ත්‍යාග මිලදී ගැනීම<br><br>(i) සුපර් බෝල් විශේෂ ලොතරැයියේ ත්‍යාග වශයෙන් ලබා දීමට නියමිත වූ ජංගම දුරකථන 20 ක් සඳහා රු. 672,860 ක මුදලක් වෙන් කර තිබූ අතර මෙම මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව සිදු කර තිබුණි. | තරගකාරී ලංසු තැබීමේ ක්‍රමය භාවිතා කරමින් ප්‍රසම්පාදන සිදු කිරීමට සහ අදාළ මාර්ගෝපදේශ අනුගමනය කිරීමට පියවර ගෙන තිබේ. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 8.9.1 ඡේදයේ (ආ) වගන්තියට අනුව, රු .500,000 ට වැඩි මුදලක භාණ්ඩ මිලදී ගැනීම සඳහා විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, අද කෝටිපති විශේෂ ලොතරැයි දිනුම් ඇදීම සඳහා රු. 1,699,500 ක් වටිනා යතුරුපැදි මිලදී ගැනීම සම්බන්ධයෙන් එවැනි එකඟතාවයකට පැමිණ තිබුණේ නැත. | මීළඟ ටෙන්ඩරයේ සිට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |
| (ඈ) පානීය ජල බෝතල් මිලදී ගැනීම (රු. 1,911,663)<br><br>විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර මණ්ඩලය පානීය ජල බෝතල් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී ආයතනයක් තෝරාගෙන තිබූ අතර 2019 වර්ෂයේ විගණන දිනය වන තෙක් ම එම ආයතනයෙන් පමණක් පානීය ජල බෝතල් මිලදී ගෙන තිබුණි. | ජල බෝතල් සැපයීම සඳහා සැපයුම්කරු වාර්ෂිකව තෝරා ගැනීමට පියවර ගෙන තිබේ. |
| (ඉ) ක්ෂණික ලොතරැයි විකුණුම් ප්‍රවර්ධනය සඳහා ටී-ෂර්ට් මිලදී ගැනීම<br>------------------------------------------------<br>ගබඩාවේ ප්‍රමාණවත් තොග තිබියදීත් නැවත මිලදී ගැනීම, නිසි අලෙවි කිරීමේ සැලැස්මක් අනුව ක්ෂණික ලොතරැයි නොපැවැත්වීම සහ මිලදී ගත් ප්‍රවර්ධන භාණ්ඩ සඳහා ක්ෂණික ලොතරැයි මුද්‍රණය කර බෙදා නොහැරීම වැනි කරුණු හේතුවෙන් ලොතරැයි අලෙවිය ප්‍රවර්ධනය සඳහා මිලදී ගත් රු. 9,075,040 ක් වටිනා ටීෂර්ට් 17,452 ක් නිකරුණේ තබා තිබුණි. | 2020 වර්ෂයේදී ක්ෂණික ලොතරැයි පත් වෙළඳපොළට නිකුත් කිරීමට පියවර ගෙන තිබේ. |
| ගිනි ආරක්ෂණ පද්ධතියක් මිලදී ගැනීම<br>------------------------------------------------<br>මණ්ඩලය 2019 වර්ෂයේදී රුපියල් 2,357,000 ක වියදමින් ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කර ඇති අතර ඒ සඳහා අවස්ථා 03 ක දී ලංසු කැඳවා ඇත. මෙම සැපයුම්කරු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයේ සෘජු මැදිහත්වීමක් නොතිබුණු අතර සැපයුම්කරු තෝරා ගැනීමෙන් පසු ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන ඇත. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව විසින් | තෝරාගත් සැපයුම්කරු යනු ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ආයතනයකි. |

| | |
|---|---|
| නිර්දේශ කර ඇති කිසිදු ආයතනයකින් ලංසු කැඳවූ බවට කිසිදු සාක්ෂියක් නොමැති අතර, ලංසුකරුවන් දෙදෙනාගෙන් එක් අයෙකු මේ සඳහා තෝරාගත් සමාගමෙහි පරිපාලිත සමාගමක් වේ. තවද, එම ආයතන දෙකම ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති ආයතන නොවේ. | |
| (I) LED ආලෝක පුවරුව මිලදී ගැනීම<br>------------------------------------<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.5 සහ 2.6 වැනි ඡේද ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීම් තීරණය කරනු ලැබිය යුතුය. එසේ වුවද, ඒ ආකාරයෙන් කටයුතු නොකර, ආයතනය සඳහා රු. 1,358,810 ක් වටිනා ඉහත සඳහන් මිලදී ගැනීම සිදු කිරීමට සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) විසින් තීරණය කර තිබුණි. | සභාපතිතුමාගේ අධිකාරී බලය මත අනුමැතිය ලබා දී ඇත. මේ වනවිටත් ගිවිසුම්ගතවී ඇති නියෝජිත ආයතන සමග මෙම සේවාව ලබාගෙන ඇත. |
| (II) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 9.8.1 (ආ) ඡේදයට අනුව, රු. 500,000 ට වැඩි මුදලක භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී එකඟතාවකට පැමිණිය යුතු වුවත්, මණ්ඩලය මෙම මිලදී ගැනීම එවැනි එකඟතාවයකට අනුව සිදු කර නැත. | ගිවිසුම්ගතවීමට ඉදිරියේදී එකඟ වේ. |
| **අනෙකුත් වැදගත් විගණන නිරීක්ෂණ**<br>**3.1 ලැබිය යුතු ගිණුම්**<br>----------------------------<br>(අ) ලොතරැයි අලෙවිය වැඩි කිරීම සඳහා ත්‍යාග වශයෙන් ප්‍රදානය කිරීම පිණිස මිලදී ගත් මෝටර් රථ දෙකක් සහ යතුරුපැදි 01 ක් ප්‍රදර්ශන රථ ලෙස අලෙවි නියෝජිතයින්ට ලබා දී තිබුණි. ප්‍රදර්ශන කාලය තුළදී එම වාහන අතරින් වාහන දෙකක් අනතුරු වලට ලක්ව තිබූ අතර එමගින් රු. 236,608 ක පාඩුවක් සිදුවී තිබේ. ඉහත සඳහන් අලාභය අලෙවි නියෝජිතයින්ගෙන් අයකර ගන්නා බව විගණනය වෙත එවන ලද මණ්ඩලයේ පිළිතුරෙහි සඳහන් කර තිබුණ ද, ලැබිය යුතු ශේෂය වශයෙන් රු. 177,667 ක මුදලක් පමණක් ගිණුම්ගත කර තිබූ අතර, ඉතිරි මුදල වන රු.58,941 ක මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. 2019 වර්ෂයේදී එයින් රු. 12,566 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි. | අලෙවි නියෝජිතයින්ගෙන් එම මුදල අය කර ගැනීමට පියවර ගත යුතුව ඇත. |
| (ආ) වොක්ෂෝල් වීදියේ පිහිටි අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා වූ ගිවිසුම මණ්ඩලය විසින් ඒකපාක්ෂිකව උල්ලංඝනය කර ඇති බැවින්, රු. 723,780 ක් වූ තැන්පතු මුදලින් සහ එම කාලය තුළදී ගෙවන ලද කුලිය වූ රු. 4,252,440 ක මුදලෙහි කොටසකින් සමන්විත වූ, එකතුව රු. 4,976,220 ක මුදලක් අයකර ගැනීමට වසර 15 ක් තිස්සේ පියවර ගෙන නොතිබුණි. | මූල්‍ය රෙගුලාසි 105 ට අනුව මුදල් අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර, කමිටුව එහි නිර්දේශය මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඒ සඳහා පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී. |
| (ඇ) මණ්ඩලයෙහි භාවිතය සඳහා මණ්ඩලය විසින් ලබා ගෙන තිබූ ගොඩනැගිල්ලක් සඳහා බාහිර පාර්ශවයකට ලබා දී තිබූ රු. 2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතුවක් අයකර ගැනීම සඳහා මෙයට වසර 23 කට පෙර මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩුව සඳහා 2016 ජනවාරි 11 වැනි දින තීන්දුව ලබා දී තිබුණි. එම තීන්දුවට අනුව අදාළ මුදල අයකර ගත යුතුව තිබුණි. කෙසේ වෙතත්, තීන්දුව ලබා දීමෙන් පසු වසර 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එම මුදල ආපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම මුදල ආපසු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. |

| | |
|---|---|
| **3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**<br><br>(අ) සාමාන්‍ය ක්‍රියා පටිපාටිය යටතේ ණය පදනම මත ලොතරැයි පත් අලෙවි කිරීමේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉහළ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ තීරණයකට අනුව අදාළ ණය මුදල පසු දින පියවිය යුතු අතර, එසේ කිරීමට නොහැකි වන්නේ නම් අදාළ අලෙවි නියෝජිතයාට ටිකට් පත් අලෙවි කිරීම අත්හිටුවනු ලැබේ. කෙසේ වෙතත්, මාස 08 සිට මාස 27 දක්වා වූ කාල පරිච්ඡේදයක් පුරා අලෙවි නියෝජිතයින් 05 දෙනෙකුගෙන් රු. 2,660,369 ක මුදලක් හිගව තිබෙන බව නිරීක්ෂණය විය. | අදාළ බෙදාහරින්නන්ගෙන් බැංකු<br><br>ඇපකර ලබා ගැනීමට පියවර ගෙන තිබේ. එමෙන්ම, හිග මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේ. |
| (ආ) 2018 අගෝස්තු 28 දින සිට සැප්තැම්බර් 21 දින දක්වා මොණරාගල පැවති එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා මණ්ඩලය විසින් රු. 3,325,821 ක මුදලක් වැය කර, අලෙවි ආදායම ලෙස රු. 4,100,000 ක මුදලක් උපයා ගෙන තිබූ අතර එම මුදල මණ්ඩලයේ විකුණුම් ඉලක්කයෙන් 41% ක් විය. කෙසේ වෙතත්, ලොතරැයි ටිකට් පතක සාමාන්‍ය අලෙවි පිරිවැය රු. 3.50 ක් වුව ද, මෙම ප්‍රදර්ශන භූමියේදී එය රු. 16.22 ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර එමගින් මණ්ඩලයේ ලාභය සාමාන්‍ය විකුණුම් ක්‍රියාකාරකම් වලින් උපයා ගන්නා ලාභයට වඩා රු. 2,607,000 ක ප්‍රමාණයකින් පහත වැටී තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම උත්සවය ප්‍රවර්ධන ක්‍රියාකාරකමක් සහ වෙළඳනාම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස පමණක් සලකනු ලැබීය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජයේ සංවර්ධන වැඩසටහන අනුගමනය කිරීම/ නියෝජනය කිරීම සිදු කළ යුතු වේ. |
| **3.3 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්**<br><br>අලෙවි ප්‍රවර්ධන කටයුතුවලට සමගාමීව පවත්වනු ලබන වැඩසටහන් සඳහා භාවිතා කිරීම පිණිස එක් දිස්ත්‍රික්කයකට කොඩි කණු 10 බැගින් වන පරිදි කොඩි කණු 250 ක් මිලදී ගැනීම සඳහා මණ්ඩලය 2018 වර්ෂයේදී රු. 1,000,000 ක පිරිවැයක් දරා තිබුණි. එසේ මිල දී ගත් කොඩි කණු තොගය මණ්ඩලයේ පරිශ්‍රයෙහි ඉතා අනාරක්ෂිත ලෙස ගබඩා කර තිබූ අතර ඒවා මිලදී ගත් දින සිට කිසිදු ප්‍රවර්ධන කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | මෙම කොඩි කණු භාවිතා කිරීමට පියවර ගෙන ඇති අතර දැනට ඒවා නිසි ලෙස ගබඩා කිරීමේ දුෂ්කරතාවයක් පවතී. |
| **3.4 ලාභදායී නොවන ගනුදෙනු**<br><br>ප්‍රචාරක උපාය මාර්ගයක් ලෙස මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයෙහි LED දැන්වීම් පුවරු නිර්මාණය කර සවි කිරීම සඳහා පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව, එහි කලා නිර්මාණ කටයුතු සහ නිෂ්පාදන කාර්යයන් සඳහා අදාළ සැපයුම්කරු වෙත රු. 952,000 ක් ගෙවා තිබුණි. එහෙත් එම කලා නිර්මාණ හා නිෂ්පාදන කාර්යයන් ඇස්තමේන්තුවේ සඳහන් කර තිබූ පරිදි සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. එමෙන්ම, එම දැන්වීම් පුවරු ස්ථානගත කර තිබූ ආකාරය අනුව ඒවා නිසි ලෙස මහජනතාවට ප්‍රදර්ශනය නොවන බව ද නිරීක්ෂණය විය. | එකඟ වූ සේවාව සැපයුම්කරුගෙන් ලබාගෙන ඇත |
| **3.4 කළමනාකරණ ක්‍රියාකාරකම්**<br><br>(අ) ලොතරැයි දිනුම් ඇදීම සඳහා මණ්ඩලය විසින් දැනට භාවිතා කරනු ලබන පරිගණක මෘදුකාංග සේවාව පෞද්ගලික සමාගමකින් ලබා ගෙන ඇත. වාර්ෂිකව මුළු වැටුප සහ දීමනා වශයෙන් රුපියල් මිලියන 6.5 ක් ලබා ගන්නා විධායක නිලධාරීන් 4 දෙනෙකු ද ඇතුළුව වැටුප් හා දීමනා වශයෙන් රුපියල් මිලියන 9 ක් ලබන සමස්ත නිලධාරීන් 08 දෙනෙකුගෙන් සමන්විත පරිගණක අංශයක් මණ්ඩලයෙහි ස්ථාපිත කර තිබුණ ද, මෙම පරිගණක ආශ්‍රිත කාර්යය ඔවුන් විසින් සිදු කර නොමැත. | ලොතරැයි කළමනාකරණ පද්ධතිය මිලදී ගැනීමට පියවර ගෙන තිබේ. කෙසේ වෙතත්, කළමනාකාරීත්ය විසින් විෂය පථය වෙනස් කර ඇත. එබැවින් නැවත ටෙන්ඩර් කැඳවිය යුතුව ඇත. |

| | |
|---|---|
| 2009 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මෙම පෞද්ගලික ආයතනයෙන් ලබාගත් සේවාවන් සඳහා රු. 130,607,657 ක මුදලක් ගෙවා ඇත. | |
| **(ආ) මණ්ඩලයේ අරමුදල් බාහිර පුද්ගලයින් විසින් රඳවා තබා ගැනීම**<br><br>2019 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දින 01 සිට දින 187 ක් දක්වා වූ කාලයක් තුළ ලොතරැයි බෙදාහරින්නන් විසින් මණ්ඩලය වෙත පියවා නොතිබූ මුදල රු. 1,638,032,144 ක් විය. එම මුදල් වහාම මණ්ඩලය වෙත අයකර ගැනීමට කළමනාකාරිත්වය විසින් තිසි පියවර ගෙන නොතිබුණි. | බෙදාහරින්නාගේ ගිණුම අවහිර කිරීමට සහ බෙදාහරින්නාගෙන් 25% ක කොමිස් මුදලක් අය කිරීමට පියවර ගෙන තිබේ. |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | **1 7,065,414,012** | 15,854,856,246 |
| ටිකට්පත් පිරිවැය | 02 | **4 60,097,151** | 402,322,679 |
| ත්‍යාග ගෙවීම | 03 | **8 ,903,494,383** | 8,296,413,110 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | **5 84,074,507** | 575,478,468 |
| **දළ ලාභය** | | **7 ,117,747,971** | 6,580,641,989 |
| වෙනත් ආදායම් | 05 | **193,820,035** | 201,525,679 |
| බෙදාහැරීම් පිරිවැය | 06 | **4 ,219,036,579** | 3,950,410,156 |
| පරිපාලන වියදම් | 07 | **5 41,799,568** | 463,619,071 |
| **මෙහෙයුම් වියදම්වලින් පසු අතිරික්තය** | | **2 ,550,731,860** | 2,368,138,441 |
| මූල්‍ය පිරිවැය | 08 | **4 38,396** | 317,927 |
| ලබානොගත් ත්‍යාග | | **3 46,837,460** | 367,426,928 |
| **බදු පෙර ලාභය** | | **2 ,897,130,924** | 2,735,247,442 |
| ආදායම් බදු | 09 | **235,073,385** | 553,166,576 |
| **ආදායම් බදු පසු ලාභය** | | **2 ,662,057,539** | 2,182,080,866 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිෂ්චිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/පාඩු | 17.1 | **6 ,735,128** | 5,523,090 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | 10 | **2,668,792,667** | 2,187,603,956 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**ජගත් පී. විජේවීර**
සභාපති/ප්‍ර.වි.නි.

**ජැනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | 11 | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | **1,221,373,015** | 715,038,048 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | | **14,665,947** | 1,583,595 |
| **අස්පෘශ්‍ය වත්කම්** | 11 | **9,549,182** | 2,459,791 |
| | | **1,245,588,144** | 719,081,433 |
| සේවක ප්‍රතිලාභ වත්කම් | 17 | **7,038,067** | 2,271,294 |
| **මළු ජංගම නොවන වත්කම්** | | **1,252,626,211** | 721,352,727 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | **51,026,204** | 80,340,650 |
| වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු | 14 | **126,012,880** | 169,375,594 |
| පූර්ව ගෙවීම් සහ තැන්පතු | 15 | **5,212,271** | 11,633,780 |
| ස්ථාවර තැන්පත් | 12 | **1,451,307,572** | 1,218,142,035 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | **795,666,048** | 461,682,393 |
| **මුළු ජංගම වත්කම්** | | **2,429,224,975** | 1,941,174,453 |
| **මුළු වත්කම්** | | **3,681,851,186** | 2,662,527,179 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **දායකත්ව ප්‍රාග්ධනය** | | | |
| ජනාධිපති අරමුදල | | **2,200,000** | 2,200,000 |
| මහපොල භාර අරමුදල | | **2,200,000** | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | | **1,103,197,285** | 971,045,950 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | | **477,792,667** | 237,466,297 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | **575,515,293** | - |
| **මුළු ස්කන්ධය** | | **2,160,905,245** | 1,212,912,247 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ගෙවිය යුතු නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියයෝජිත තැන්පතු | 18 | **36,110,381** | 35,395,381 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **36,110,381** | 35,395,381 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 19 | **563,493,496** | 671,110,675 |
| ගෙවිය යුතු ත්‍යාග | 20 | **760,794,203** | 648,835,116 |
| ගෙවිය යුතු ණය වව්චර් | | **160,547,860** | 94,273,760 |
| **මුළු ජංගම වගකීම්** | | **1,484,835,560** | 1,414,219,551 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **3,681,851,186** | 2,662,527,179 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**ජගත් පී. විජේවීර**
සභාපති/ප්‍ර.වි.නි.

**ජැනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | **2 ,897,130,924** | 2 ,735,247,442 |
| **ගැළපීම්** | | | |
| ස්ථාවර වත්කම් මත ක්ෂය කිරීම | | **80,242,809** | 52,893,461 |
| ත්‍යාග සංචිත ගිණුම | | **132,151,335** | 161,016,492 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | **8,395,852** | 8,466,827 |
| ගෙවන ලද පාරිතෝෂික | | **(1,031,009)** | (362,160) |
| පොළී ආදායම | | **(173,307,868)** | (184,691,737) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය | | - | (5,486,000) |
| ගෙවන ලද ආදායම් බදු | | **(27,382,719)** | (5,641,660) |
| ගෙවන ලද පෙර ආදායම් බදු | | **(190,444,919)** | (724,500,149) |
| ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල් | | **(2,428,466,297)** | (2,058,000,000) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **297,288,108** | (21,057,483) |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| බඩු තොග වැඩිවීම/අඩුවීම | | **29,314,446** | (21,985,247) |
| ණය ගැතියන් වැඩිවීම/අඩුවීම | | **43,362,714** | 25,980,874 |
| තැන්පතු හා පෙරගෙවුම් වැඩිවීම/අඩුවීම | | **6 ,421,509** | (5,160,049) |
| **මෙහෙයුම් වගකීම් වැඩිවීම/අඩුවීම** | | | |
| ණය හිමියන් වැඩිවීම/අඩුවීම | | **(140,214,431)** | 71,753,041 |
| ගෙවිය යුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම | | **111,959,087** | (49,653,129) |
| ණය වවුචර් වැඩිවීම/අඩුවීම | | **66,274,100** | (153,153,980) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **414,405,553** | (153,275,974) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ප්‍රවාහ** | | | |
| ස්ථාවර වත්කම් එකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ) | | **(15,882,721)** | (101,448,496) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම (දේපළ, පිරියත සහ උපකරණ) | | | 5 ,486,000 |
| පොළී ආදායම | | **173,307,868** | 184,691,737 |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | | **(238,562,026)** | (215,165,497) |
| නියෝජිතයන් හා බෙදාහරින්නන්ගේ තැන්පතුවල වැඩි වීම | | **715,000** | 1 ,912,500 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(80,421,879)** | (124,523,756) |
| | | **333,983,654** | (277,799,730) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ හී ශුද්ධ වැඩිවීම/අඩුවීම | | **333,983,654** | (277,799,730) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | **461,682,393** | 739,482,123 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | **795,666,048** | 461,682,393 |
| බැංකුවේ ඇති මුදල් — ලංකා බැංකුව | | **485,654,516** | 311,991,571 |
| මහජන බැංකුව | | **268,621,669** | 105,717,241 |
| සම්පත් බැංකුව | | **41,373,458** | 43,957,177 |
| අත ඇති මුදල් | | **16,404** | 16,404 |
| | | **795,666,048** | 461,682,393 |

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | ජනාධිපති අරමුදල සහ මහපොළ භාර අරමුදල | ත්‍යාග සංචිත ගිණුම | රඳවාගත් ඉපැයීම් | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2018.01.01 දිනට ශේෂය | 4,400,000 | 810,029,458 | 107,862,341 | - | 922,291,799 |
| වර්ෂය තුළ එකතු කිරීම් | | 161,016,492 | 2,187,603,956 | | 2,348,620,448 |
| **පෙර වර්ෂයේ ගැලපීම්** | | | | | |
